# ජාතික පුස්තකාල











ජී. ඩී. අමරසිරි

ජාතික පුස්තකාල

## කර්තෘගේ වෙනත් කෘති

01 ළමා පුස්තකාලයාධිපතිත්වය (පරිවර්තන) 1998

02 තොරතුරු සාක්ෂරතාවය 2004

03 පුස්තකාල සංඛ්‍යාංකකරණය 2008

# ජාතික පුස්තකාල

## ජී ඩී අමරසිරි

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා
මණ්ඩලය

ජාතික පුස්තකාල
ප්‍රථම මුද්‍රණය 2012
© ජී ඩී අමරසිරි

ISBN 978-955-8383-76-6

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය ප්‍රකාශනගත සූචිකරණ දත්ත

අමරසිරි. ජී. ඩී.
ජාතික පුස්තකාල / ජී. ඩී. අමරසිරි.- කොළඹ : ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, 2012
පි. 67 ; සෙමී. 21

ISBN 978-955-8383-76-6

i. 027.5 ඩිවි 23 ii. ග්‍රන්ථනාමය

1. ජාතික පුස්තකාලය

පරිගණක අක්ෂර සංයෝජනය: තනුජා රංගිකා
පිටකවර නිර්මාණය : රුවිනි දිල්රුක්ෂි
සෝදුපත් බැලීම : ඩබ් සුනිල්
ප්‍රකාශනය : ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
මුද්‍රණය : සමයවර්ධන මුද්‍රණශිල්පියෝ (පෞද්.) සමාගම
අංක : 53,
හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි මාවත,
(මාළිගාකන්ද පාර)
මරදාන, කොළඹ 10.

## පිදුම

අප අතරින් වියෝ වූ
ප්‍රවීන පුස්තකාලවේදී
එන් යූ යාපා මහතාගේ
නාමයට ගෞරවයෙන් පිළිගන්වමි

# පෙරවදන

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් කටයුතු කරන ජී. ඩී. අමරසිරි මහතා විසින් රචනා කරන ලද **ජාතික පුස්තකාල** නැමති මෙම ග්‍රන්ථය පුස්තකාල විෂය මෙන් ම **ජාතික පුස්තකාල** පිළිබඳ උනන්දුවක් දක්වන පුස්තකාලවේදීන්ටත් සාමාන්‍ය පාඨකයින්ටත් පුස්තකාල විද්‍යාව හදාරන සිසු සිසුවියන්ටත් ප්‍රයෝජනවත් වේ යයි විශ්වාස කරමි. පුස්තකාල විෂයය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ පළ වී ඇත්තේ පොත් සීමිත සංඛ්‍යාවකි. එබැවින් මෙම ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වඩ වඩා පොතපත පළ කිරීම කාලීන අවශ්‍යතාවකි. ජාතික පුස්තකාල පිළිබඳ හැඳින්වීමක් සිංහල පාඨකයාට ඉදිරිපත් කිරීමට කතුවරයා මෙම පොත මගින් උත්සාහ කර ඇත. ජාතික පුස්තකාල සංකල්පය, ජාතික පුස්තකාල කාර්යයන්, ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය, ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය සංවර්ධනයේ දී මුහුණ දෙන අභියෝග, වෙනත් රටවල ජාතික පුස්තකාල වැනි තොරතුරු මෙම ග්‍රන්ථයේ ඇතුළත් කර ඇත. ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය මෑතකදී පිහිටුවීම නිසා ශ්‍රී ලාංකික ප්‍රජාව තුළ ඒ පිළිබඳ දැනුවත්භාවය අඩුවීම ගැටලුවක්ව පවතී. මෙම දැනුවත්භාවය වර්ධනය කිරීම සඳහා මෙම ග්‍රන්ථය ඉවහල් වනු ඇතැයි සිතමි. ජාතික පුස්තකාලය පිළිබඳ දැනුවත්භාවය වර්ධනය කිරීම තුළින් ජාතික පුස්තකාල සම්පත් වැඩිවශයෙන් භාවිත කිරීමට පාඨකයින් පෙළඹවිය හැකිය. එමෙන්ම පුස්තකාල විද්‍යාව හදාරන අයට ද ජාතික පුස්තකාල පිළිබඳ දැනුම පහසුවෙන් ලබාගැනීමට ද මෙම ග්‍රන්ථය ඉවහල් වේ යයි සිතමි.

මහාචාර්ය සෝමරත්න බාලසූරිය
සභාපති
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

# හැඳින්වීම

ලෝකයේ වෙනත් රටවල් සමග සසඳන විට ශ්‍රී ලංකාවේ ජාතික පුස්තකාලය පිහිටුවීම සිදුවූයේ මෑතකදී ය. 1990 වර්ෂයේ දී ආරම්භ කරන ලද ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය තවමත් වර්ධනය වන ආයතනයකි. එබැවින් ජාතික පුස්තකාල සංකල්පය පිළිබඳ අවබෝධය ශ්‍රී ලාංකීය ප්‍රජාව තුළ තවමත් පුළුල් ලෙස ව්‍යාප්ත වී නොමැත. එමෙන්ම දේශපාලන බලධාරීන් තුළ ද නිලධාරීන් තුළ ද ජාතික පුස්තකාල සංකල්පය පිළිබඳ අවබෝධය පුළුල් ලෙස ව්‍යාප්ත වී නොමැති බව පෙනේ. මෙම හේතුව, ජාතික පුස්තකාලයේ දිගුකාලීන පැවැත්ම කෙරෙහි ද අහිතකර ලෙස බලපෑමට පුළුවන. මෙම තත්ත්වය වළක්වා ගැනීම සඳහා හැකිතාක්දුරට ජාතික පුස්තකාලයක වැදගත්කම හා එහි ජාතික කාර්යභාරය පිළිබඳ අවබෝධය ප්‍රජාව තුළ වර්ධනය කිරීම කාලීන අවශ්‍යතාවක් බවට පත්ව ඇත. එමෙන්ම ජාතික පුස්තකාල සම්පත් භාවිත කිරීමට විද්වතුන් හා සාමාන්‍ය ජනතාව පෙළඹවීම සඳහා ද මෙම අවබෝධය වර්ධනය කිරීම අවශ්‍ය වේ. ජාතික පුස්තකාල පිළිබඳ ග්‍රන්ථයක් සිංහල භාෂාවෙන් පළ වී නො තිබීම ද මෙම ග්‍රන්ථය සම්පාදනය කිරීමට එක් හේතුවක් විය. ජාතික පුස්තකාල සංකල්පය, ජාතික පුස්තකාල කාර්යයන්, ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය, වෙනත් රටවල ජාතික පුස්තකාල වැනි තොරතුරු මෙම ග්‍රන්ථය තුළ ඇතුළත් කර ඇත. මෙම ග්‍රන්ථය පුස්තකාලයාධිපතිවරුන්ටත්, පුස්තකාල ක්ෂේත්‍රයේ නිලධාරීන්ටත්, ගුරුවරුන්ටත්, පුස්තකාල විද්‍යාව හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ටත්, සාමාන්‍ය පාඨකයින්ටත් ප්‍රයෝජනවත් ග්‍රන්ථයක් වේ යයි විශ්වාස කරමි. මෙම ග්‍රන්ථය ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අනුග්‍රහයෙන් පළ කරදීම වෙනුවෙන් එහි සභාපති

මහාචාර්ය සෝමරත්න බාලසූරිය මහතාටත් වැඩබලන අධ්‍යක්ෂ ජනරාල් එන්. එච්. එම්. චිත්‍රානන්ද මහතාටත් ස්තුතිවන්ත වෙමි. මම ග්‍රන්ථය සඳහා තොරතුරු සොයා ගැනීමට උපකාර කළ ප්‍රියංගා බණ්ඩාර මහත්මියටත්, උදය කබ්රාල් මහතාටත් යතුරු ලියන කටයුතු කළ තනුජා රංගිකා මහත්මියටත්, සෝදුපත් පරික්ෂා කළ ඩබ්. සුනිල් මහතාටත්, පිටකවරය නිර්මාණය කළ රුවිනි දිල්රුක්ෂි මෙනවියටත්, ප්‍රකාශන කටයුතු සිදුකළ මණ්ඩලයේ ප්‍රකාශන කටයුතු භාර සහකාර අධ්‍යක්ෂිකා ශ්‍රීමා සූරියබණ්ඩාර මහත්මියටත්, නිවසේදී පොත ලිවීමේ කටයුතුවලට උදව් කළ බිරිඳ හිරෝමාටත් මිනුප හා සඳුප පුතුන් දෙදෙනාටත් ස්තුති වන්ත වෙමි.

ජී. ඩී. අමරසිරි

# පටුන


| | පිටුව |
|---|---|
| පළමු පරිච්ඡේදය | |
| ජාතික පුස්තකාල සංකල්පය | 01 |
| දෙවන පරිච්ඡේදය | |
| ජාතික පුස්තකාල කාර්යයන් | 11 |
| තුන්වන පරිච්ඡේදය | |
| ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය | 20 |
| හතරවන පරිච්ඡේදය | |
| ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය සංවර්ධනයේ දී මුහුණ දෙන අභියෝග | 34 |
| පස්වන පරිච්ඡේදය | |
| වෙනත් රටවල ජාතික පුස්තකාල | 40 |

# පළමුවන පරිච්ඡේදය

# ජාතික පුස්තකාල සංකල්පය

ජාතික පුස්තකාලය යනු කිසියම් රටක පුස්තකාල පද්ධතියේ කේන්ද්‍රස්ථානය වේ. ජාතියක අනන්‍යතාව විදහා දක්වන සංකේත ගණනාවක් ඇත. ජාතික කොඩිය, ජාතික ගීය, ජාතික පුෂ්පය එවැනි සංකේත වේ. ජාතික පුස්තකාලය ද රටක අනන්‍යතාව පෙන්වන සංකේතයකි. රටක බිහිවන තොරතුරු සම්පත් එරටට අනන්‍ය වූවකි. රටක තොරතුරු සම්පත් ඒකරාශී කර වර්තමාන හා අනාගත පරම්පරාවන්ගේ ප්‍රයෝජනය සඳහා ආරක්ෂා කරනුයේ ජාතික පුස්තකාලය විසිනි. ලෝකයේ බොහෝ රටවල ජාතික පුස්තකාල පිහිටුවා ඇත. එක්සත් රාජධානිය, ඇමරිකා එක්සත් ජනපදය, ඉන්දියාව, ජපානය, නවසීලන්තය, තායිලන්තය, ඕස්ට්‍රේලියාව, සිංගප්පූරුව, බංග්ලාදේශය, කොරියාව, මහජන චීන ජනරජය, මැලේසියාව, ඉරානය ජාතික පුස්තකාල පිහිටුවා ඇති රටවලට උදාහරණ කිහිපයකි.

ලෝකයේ සමහර රටවල ජාතික පුස්තකාලවලට දීර්ඝ ඉතිහාසයක් ඇත. උදාහරණ වශයෙන් ඉන්දියාව තායිලන්තය වැනි රටවල ජාතික පුස්තකාල වසර සියයකටත් වඩා පැරණිය. තායිලන්ත ජාතික පුස්තකාලයේ සියවන සංවත්සරය සමරන ලද්දේ 2005 වසරේ දී ය.

ජාතික පුස්තකාලයක් අනෙකුත් පුස්තකාලවලින් වෙනස්වන සාධක ගණනාවක් ඇත. මහජන පුස්තකාල පාසල් පුස්තකාල හෝ වෙනත් පුස්තකාලයකින් ලබාදෙන සේවය කිසියම් සීමිත ප්‍රදේශයකට හෝ කණ්ඩායමකට සීමාවේ. උදාහරණ වශයෙන් මහජන පුස්තකාලයක්

මගින් සේවා සපයනුයේ අදාළ පළාත් පාලන බල ප්‍රදේශයේ ජනතාවට පමණි. පාසල් පුස්තකාලයක සේවය ලබා දෙනුයේ අදාළ පාසලේ සිසු සිසුවියන්ට හා ගුරු මණ්ඩලයට පමණි. නමුත් ජාතික පුස්තකාලයක සේවාවන් එසේ සීමිත කණ්ඩායමකට සීමා නොවේ. ජාතික පුස්තකාලයක සේවය සෑම රටවැසියෙකුටම හෝ රටේ ඕනෑම ප්‍රදේශයක සිටින සෑම අයෙකුටම ලබා ගැනීමේ අයිතිය ඇත.

රටක් තුළ පළවන සියලුම ප්‍රකාශන ජාතියේ අවශ්‍යතාව සඳහා එක්රැස් කර තබා ගැනීමේ වගකීම පැවරෙන්නේ ජාතික පුස්තකාලයටයි. එහිදී පොත්පත් පමණක් නොව සඟරා, පුවත්පත්, ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය, විමර්ශන මූලාශ්‍ර, විද්‍යුත් මාධ්‍ය, අත්පිටපත්, දුර්ලභ පොත්, සිතියම් ආදි සියලුම දැනුම අඩංගු මාධ්‍ය ජාතික පුස්තකාල තුළ එක්රැස් කළ යුතු වේ. පිළිගත් නිර්වචන අනුව ජාතික පුස්තකාලයක ප්‍රධාන වගකීම රටතුළ පවතින ලේඛන උරුමය ඒකරාශිකර සංරක්ෂණය කර ජනතා ප්‍රයෝජනය සඳහා තොරතුරු ලබාදීමයි. මෙම වගකීමට අමතරව තවත් අමතර වගකීම් ගණනාවක් ද ජාතික පුස්තකාලය විසින් ඉටු කළ යුතු බව පිළිගත් මතය වේ. ජාතික ග්‍රන්ථ නාමාවලිය සම්පාදනය, ජාතික මට්ටමේ අනෙකුත් ග්‍රන්ථ විඥාපන හා ප්‍රලේඛන සේවා පවත්වාගෙන, යාම ජාතික ග්‍රන්ථ විඥාපන ප්‍රමිති සම්පාදනය, ජාතික ඒකාබද්ධ සූචිය පවත්වාගෙන යාම, පුස්තකාල ක්ෂේත්‍රයේ පර්යේෂණ පැවැත්වීම ආදිය මෙම අමතර කාර්යයන් වේ. ජාතියේ ලේඛන උරුමය එක් රැස්කිරීමේ දී ජාතික පුස්තකාලයක් විසින් අනුගමනය කරන ප්‍රතිග්‍රහණ ක්‍රම හෙවත් ප්‍රකාශන අත්පත් කර ගැනීමේ ක්‍රම කිහිපයක් ඇත. මිල දී ගැනීම, නීතිමය තැන්පතු ක්‍රමය හා පරිත්‍යාග වශයෙන් ලබා ගැනීම ප්‍රධාන ක්‍රම වේ. නීතිමය තැන්පතු ක්‍රමය යටතේ සෑම මුද්‍රණකරුවෙක්ම තම ප්‍රකාශනවලින් කිසියම් පිටපත් ප්‍රමාණයක්

ජාතික ලේඛනාගාරයේ හෝ වෙනත් නියම කරනු ලබන ආයතනයක තැන්පත් කිරීමට නීතියෙන් බැඳී සිටියි. ශ්‍රී ලංකාවේ මෙම නීතිය ක්‍රියාත්මක කරනු ලබන්නේ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව මගිනි. ඒ අනුව ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත් කරන සෑම ප්‍රකාශනයකම පිටපත් පහක් ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ තැන්පත් කළ යුතු වේ. මෙම පිටපත් පහෙන් එක් පිටපතක් බැගින් ජාතික පුස්තකාලයටත් කෞතුකාගාර දෙපාර්තමේන්තු පුස්තකාලයටත්, පේරාදෙනිය විශ්වවිද්‍යාලයීය පුස්තකාලයටත් තැන්පතු පිටපත් වශයෙන් ලබා දෙනු ලැබේ. වෙනත් පුස්තකාලයක් මෙන් නොව පොත්පත් හා වෙනත් පුස්තකාල සම්පත් ඒකරාශී කිරීමට අමතරව ජාතික පුස්තකාලයකට පැවරෙන වෙනත් අවශේෂ කාර්යයන් ගණනාවක් ද ඇත. ජාතික ග්‍රන්ථ නාමාවලිය සම්පාදනය, ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනය, ජාතික මට්ටමේ ප්‍රලේඛන සේවා පවත්වා ගෙන යාම, පුස්තකාල ක්ෂේත්‍රයේ පර්යේෂණ පැවැත්වීම, පුස්තකාලයාධිපතින් පුහුණු කිරීම, රට තුළ ඇති අනෙකුත් පුස්තකාල සංවර්ධනය සඳහා ආධාර කිරීම, මෙම අවශේෂ කාර්යයන් වේ. එමෙන් ම රටේ පුස්තකාල පද්ධතිය සඳහා නායකත්වය ලබාදීම ද ජාතික පුස්තකාලයක වගකීමක් වේ.

මෙම කාර්යන් ඉටු කිරීම සඳහා රජය මගින් නීතිමය බලය (Legislative power) ලබාදිය යතු අතර රජයේ භාණ්ඩාගාරය මගින් සෘජුවම මුදල් ප්‍රතිපාදන ලබා දිය යුතු වේ. ජාතික පුස්තකාලයක් පිහිටුවීමේ මූලික පියවර වන්නේ ඒ සඳහා නිතිමය පදනමක් ලබා දීමයි. ලෝකයේ සෑම ජාතික පුස්තකාලයක්ම පාහේ පිහිටුවා ඇත්තේ ජාතික පුස්තකාල පනතක් මගිනි. ලෝකයේ රටවල ජාතික පුස්තකාල පනත්වල ස්වභාවය රදා පවතින්නේ එම රටවලට ආවේනික වූ තත්ත්වයන්ට අනුවයි. සෑම ජාතික පුස්තකාල පනතක් මගින් ම සැලකිල්ල යොමුකර ඇත්තේ ජාතික පුස්තකාල පරිපාලනය,

කාර්යයන්, වගකීම්, මුදල් ප්‍රතිපාදන යන කරුණු සම්බන්ධයෙනි. සමහර රටවල ජාතික පුස්තකාල පනත් මගින් එම රටවල පුස්තකාල සේවාවන් සැලසුම් කිරීමට හා අධීක්ෂණයට බලය ලබා දී තිබේ. සමහර රටවල පුස්තකාල සේවාවන් ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික පුස්තකාලයට නායකත්ව බලය ලබා දීම සඳහා ජාතික පුස්තකාල පනත් නවීකරණය කර ඇත.

බොහෝ රටවල ජාතික පුස්තකාල අධ්‍යයනය කරන විට පෙනී යන කරුණක් නම් බොහෝ ජාතික පුස්තකාල කළමනාකරණ මණ්ඩලයක් මගින් පාලනයවන බවයි. එහි ප්‍රධානියා වශයෙන් කටයුතු කරනුයේ ජාතික පුස්තකාලයාධිපතිවරුන් (National Librarian), අධ්‍යක්ෂ ජනරාල්වරයෙක් හෝ අධ්‍යක්ෂවරයෙකි. කළමනාකරණ මණ්ඩලය හෝ අධ්‍යක්ෂ මණ්ඩලය ආයතනයේ පරිපාලනයට අදාළ උපදෙස් හා මග පෙන්වීම් ලබා දෙනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලය බොහෝ විට පත් කරනු ලබන්නේ අදාළ විෂය භාර අමාත්‍යවරයා විසිනි.

ජාතික පුස්තකාල පිහිටුවා නොමැති ලෝකයේ සමහර ඌන සංවර්ධිත රටවල් ජාතික පුස්තකාලයට විකල්පයක් වශයෙන් ජාතික මහජන මධ්‍ය පුස්තකාලයක් (National Public Central Library) පවත්වාගෙන යනු ලැබේ. ජාතික මහජන මධ්‍ය පුස්තකාලය එම රටේ මහජන පුස්තකාල පද්ධතියේ කේන්ද්‍රස්ථානය වන අතර ප්‍රතිග්‍රහණය පිරිසැකසුම කාර්ය මණ්ඩල පුහුණුව වැනි මධ්‍යගත සේවා පවත්වාගෙන යනු ලැබේ. ජාතික පුස්තකාල එකතුවක් සඳහා අවශ්‍යවන මධ්‍යගත එකතුවක් මෙම පුස්තකාලවල ගොඩනැගීම මෙම පුස්තකාල මගින් සිදු කෙරේ. මැලේසියාව සිංගප්පූරුව වැනි රටවල ජාතික පුස්තකාල මධ්‍යම මහජන පුස්තකාල (Central Public Library) වශයෙන් ද කටයුතු කරයි.

ජාතික පුස්තකාලයක් නිර්වචනය කිරීම සැබැවින්ම අපහසුය. විවිධ රටවල ජාතික පුස්තකාල ප්‍රමාණය ස්වභාවය හා කාර්යයන් අනුව වෙනස්කම් පවතී. මෙම රටවල විවිධ පුස්තකාල මගින් ජාතික පුස්තකාල කාර්යයන් අඩු වැඩි වශයෙන් ඉටුකරමින් පවතී.

## ජාතික පුස්තකාල අවශ්‍ය ඇයි?

ඕනෑම රටක විවිධ වර්ගයේ පුස්තකාල ක්‍රියාත්මක වේ. මහජන පුස්තකාල අධ්‍යයන පුස්තකාල (Academic Libraries) විශේෂ පුස්තකාල, (Special Libraries) පාසැල් පුස්තකාල (School Libraries) මෙම ප්‍රධාන පුස්තකාල වර්ග වේ. මෙම පුස්තකාල සඳහා පුස්තකාල ද්‍රව්‍ය ඒකරාශී කිරීමේ දී හා සේවා සැපයීමේ දී ප්‍රාදේශීය වශයෙන් හා ආයතනික වශයෙන් සීමාවන් පවතී. උදාහරණ වශයෙන් මහජන පුස්තකාලයක් මගින් එක්රැස් කරනුයේ එම මහජන පුස්තකාලයට අදාළ බල ප්‍රදේශයේ පාඨකයින් සඳහා වන පුස්තකාල ද්‍රව්‍ය පමණි. මහජන පුස්තකාලයක් මගින් සේවා සපයනුයේ ද අදාළ බලප්‍රදේශයේ පාඨක ප්‍රජාවට පමණි. අධ්‍යයන පුස්තකාලයක් හෝ විශේෂ පුස්තකාලයක් එක්රැස් කරනුයේ එම ආයතනයේ විෂය මාලාවට හෝ කාර්යයන්ට අදාළ තොරතුරු ඇතුළත් පුස්තකාල ද්‍රව්‍ය වේ. ඒවා සේවා සපයනුයේ ද එම ආයතනවල කාර්ය මණ්ඩලයට හා සිසුන්ට පමණි. නමුත් රටතුළ සම්පාදනය කරනු ලබන සමස්ත ලේඛන උරුමය ඒකරාශී කිරීමට මෙම පුස්තකාලවලට නොහැකිය. රට තුළ සම්පාදනය කරනු ලබන ලේඛන සම්භාරය ඒකරාශීකර සංරක්ෂණය කර වර්තමාන හා අනාගත පරම්පරාවන්ගේ ප්‍රයෝජනය සඳහා පවත්වාගෙන යාම සඳහා කිසියම් ආයතනයක් තිබිය යුතුය. ජාතික පුස්තකාල බිහි වී ඇත්තේ මෙම පරමාර්ථය ඉටුකර ගැනීම සඳහාය. වෙනත්

පුස්තකාලයට මෙම කාර්යය ඉටු කළ නොහැකිය. වෙනත් පුස්තකාලයකට මෙම කාර්ය ඉටුකිරීමට නීතිමය වශයෙන් හෝ මූල්‍යමය වශයෙන් බලයක් හා හැකියාවක් නොමැත.

ජාතික පුස්තකාලයක් විසින් රටතුළ ජීවත්වන ජනතාවගේ තොරතුරු අවශ්‍යතා හඳුනා ගත යුතු වේ. ජාතික වශයෙන් පවතින තොරතුරු අවශ්‍යතා ඉටුකරලීම ජාතික පුස්තකාලයක වගකීම වේ. මෙහිදී ජාතික අවශ්‍යතා යනුවෙන් අදහස් කරන්නේ ප්‍රාදේශීය පුස්තකාලවලට ඉටුකළ නොහැකි තොරතුරු අවශ්‍යතාවන්ය. ජාතික පුස්තකාලයක් විසින් තොරතුරු සේවාවන් මුළු රටටම අවශ්‍යවන පරිදි ජාතික මට්ටමින් ඉටු කළ යුතුය. රට තුළ බිහිවන සියලුම ප්‍රකාශන ඒකරාශි කර සංරක්ෂණය කර සේවා සැපයීම සංවර්ධනය වෙමින් පවතින රටකට පහසු කාර්යයක් නොවන අතර එය විශාල අභියෝගයකි. බොහෝ පුස්තකාල රටපුරා විසිරී පැවතී. නමුත් ජාතික පුස්තකාල පවතින්නේ රටකට එකක් පමණි. බොහෝවිට ජාතික පුස්තකාලය පිහිටුවා තිබෙන්නේ අග නගරය කේන්ද්‍රකරගෙනය. එබැවින් රටේ සියලුම ප්‍රදේශවල ජීවත්වන ජනතාවට ජාතික පුස්තකාලය පරිහරණය කිරීමට අවස්ථාවක් නො ලැබේ. ජාතික පුස්තකාලය බොහෝවිට පරිහරණය කරනුයේ ජාතික පුස්තකාලය අවට සීමිත ප්‍රදේශයක ජීවත්වන පාඨක ප්‍රජාවන්ය. රටේ අනෙකුත් ප්‍රදේශවල දියුණු පුස්තකාල පද්ධතියක් තිබේ නම් මෙම ගැටලුව එතරම් බරපතල නොවේ. නමුත් සංවර්ධනය වෙමින් පවතින බොහෝ රටවල එවැනි දියුණු පුස්තකාල පද්ධති නොමැත.

ජාතික පුස්තකාල විමර්ශන පුස්තකාල (Reference Library) ලෙස පවත්වාගෙන යාම පිළිගත් සම්ප්‍රදායකි. මෙහිදී පොත් බැහැරදීමක් සිදු නොකරන අතර පුස්තකාලයට පැමිණ විමර්ශන කටයුතු සඳහා පමණක් ඉඩ ලබාදේ. අවශ්‍ය ලේඛන වල ඡායා පිටපත් ලබාදීමට කටයුතු කරනු ලැබේ. ජාතික පුස්තකාල මෙසේ විමර්ශන පුස්තකාල

වශයෙන් පමණක් පවත්වාගෙන යාමේ අරමුණ වන්නේ ජාතික එකතුව ආරක්ෂා කර ගැනීමයි. පොත් බැහැර දීමට ලබා දුන් විට පොත් අස්ථානගත වීමත් හානිවීමත් වැළැක්විය නොහැකිය. තොරතුරු සේවා ලබා දෙන අතර ජාතියේ ලේඛන උරුමය ආරක්ෂා කිරීම ද ජාතික පුස්තකාලයක වගකීම වේ. සමහර රටවල ජාතික පුස්තකාල පොත් බාහැර දීමේ සේවාව ද පවත්වාගෙන යයි. ඊට හේතුව ප්‍රධාන නගරය තුළ මහජන පුස්තකාල සේවාවක් නො තිබීමයි. ශ්‍රී ලංකාවේ ජාතික පුස්තකාලය ද පවත්වාගෙන යනු ලබන්නේ විමර්ශන පුස්තකාලයක් වශයෙනි.

ජාතික පුස්තකාලයක් සේවා සැපයීමේ දී ප්‍රමුඛතාව දියයුත්තේ කුමන වර්ගයේ පාඨක කණ්ඩායම්වලට ද යන්න විවාදයට භාජනය වී ඇති කරුණකි. මේ පිළිබඳව විශේෂ සමීක්ෂණ ද සිදුකර ඇත. සමහර විශේෂඥයින්ගේ මතය වී ඇත්තේ කළමනාකරණ ක්ෂේත්‍රයේ විධායක නිලධාරීන්, විද්‍යා, නිෂ්පදන, සංස්කෘතිය, කලා ආදි ක්ෂේත්‍රවල විශේෂඥයින් මාධ්‍ය ක්ෂේත්‍රයේ විශේෂඥයින් හා නව නිපැයුම්කරුවන් වැනි අයට ප්‍රමුඛතාව දිය යුතු බවයි. මෙම කණ්ඩායම් ජාතික වශයෙන් විශාල වගකීමක් ඉටුකරන නිසා මේ අය කෙරෙහි වැඩි ප්‍රමුඛතාවක් දැක්විය යුතු බව මෙම සමීක්ෂණවලට භාජනය කළ විශේෂඥයින්ගේ මතය විය. එමෙන්ම ජාතික පුස්තකාල සේවාවන් රටේ සියලුම ජනතාවට සමව ලබාදිය යුතුය යන මතය ද ඉදිරිපත්ව ඇත. ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය ද රටේ සියලුම පාඨකයින්ට සේවා සපයන අතර පර්යේෂකයින් වැඩියෙන් ආකර්ෂණය කරගැනීමට උත්සාහ දරයි.

රටක සංවර්ධනය සඳහා ජාතික පුස්තකාලයකට දායක විය හැකි ආකාර ගණනාවක් ඇත. ලෝකයේ සමහර රටවල ජාතික පුස්තකාලවලට රටතුළ ඇති අනෙකුත් පුස්තකාල සම්බන්ධයෙන් ඍජු වගකීමක් තිබේ. නමුත් සමහර ජාතික පුස්තකාලවලට ඇත්තේ

උපදේශාත්මක කාර්යභාරයක් පමණි. උදාහරණ වශයෙන් ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයට ඇත්තේ එවැනි උපදේශාත්මක බලයක් පමණි. ශ්‍රී ලංකාවේ අනෙකුත් පුස්තකාල සම්බන්ධයෙන් සෘජු පාලනයක් ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයට නැත. කෙසේ වුවද රට තුළ ඇති අනෙකුත් පුස්තකාලවල මව් පුස්තකාලය ලෙස ජාතික පුස්තකාලය කටයුතු කළ යුතු අතර ඒවායේ සංවර්ධනය සඳහා සහාය වීම හා උපදෙස් දීම කළ යුතුය. එහිදී පුස්තකාල පිහිටුවීමට හා පවත්වාගෙන යාමට උපදෙස් දීම හා සහාය වීම පුස්තකාල කාර්ය මණ්ඩල පුහුණු කිරීම ජාතික එකතුව පවත්වාගෙන යාම ජාතික ග්‍රන්ථ විඥාපන මධ්‍යස්ථානය වශයෙන් ජාතික ග්‍රන්ථ නාමාවලිය හා අනෙකුත් ජාතික මට්ටමේ ග්‍රන්ථ විඥාපන හා ප්‍රලේඛන සේවා පවත්වාගෙන යාම කළ යුතුවේ. ජාතික ග්‍රන්ථ නාමාවලිය හැකිතාක් කාලීනව හා සම්පූර්ණ ලෙස සම්පාදනය කළ යුතු වේ. රටතුළ පලවන ප්‍රකාශන පිළිබඳ තොරතුරු ලබාගත හැකි නිල ලේඛනය ජාතික ග්‍රන්ථ නාමාවලිය වේ.

ජාතික පුස්තකාල පිහිටුවා නොමැති සමහර රටවල් ජාතික පුස්තකාල පිහිටු වීම සඳහා සැලසුම් සකස් කරනු ලබයි. යුනෙස්කෝ සංවිධානය ද මේ සඳහා සහයෝගය දක්වයි. ආර්ථික දේශපාලන සමාජ හා සංස්කෘතික තත්ත්වයන් එක් රටකින් තවත් රටකට වෙනස්වේ. ජාතික පුස්තකාල පිහිටුවීමේදී ඒ ඒ රටවලට අනන්‍ය වූ මෙම තත්ත්වයන් සැලකිල්ලට ගත යුතුය. ලෝකයේ සෑම ජාතික පුස්තකාලයක්ම සමරූපී බවකින් තිබිය යුතුය, යන්න අපේක්ෂා නොකෙරේ. ඒ ඒ රටවල සමාජ සංස්කෘතික තත්ත්වයන් අනුව වෙනස්කම් තිබිය හැකිය. කෙසේ වුවද ජාතික පුස්තකාලයක් මගින් ඉටුකළ යුතු යයි ජාත්‍යන්තර වශයෙන් පිළිගත් මූලික කාර්යයන් සෑම ජාතික පුස්තකාලයක්ම ඉටුකිරීම අපේක්ෂා කෙරේ. ජාත්‍යන්තරව පිළිගත් නිර්වචන අනුව ජාතික පුස්තකාලයක මූලික

වගකීම රටතුළ බිහිවන ලේඛන උරුමය ඒකරාශිකර සංරක්ෂණය කිරීමත් ඒ මගින් රටේ පාඨක ජනතාවගේ තොරතුරු අවශ්‍යතා ඉටුකරලීමත්ය. එමෙන්ම රටට වැදගත්වන විදේශ ප්‍රකාශන ලබාගැනීම ජාතික පුස්තකාලයකින් අපේක්ෂා කෙරේ.

ජාතික පුස්තකාල සංකල්පය පිළිබඳ අවබෝධයක් බොහෝ අය තුළ නොමැති බව පෙනේ. ජාතික පුස්තකාලය තවත් එක් පුස්තකාලයක් හෝ මහජන පුස්තකාලයක් ලෙස සමහර අය දකිති. ජාතික පුස්තකාලයක් වැදගත් වූවත් අත්‍යවශ්‍ය නොවන බව සමහර අය කල්පනා කරති. එබැවින් ජාතික පුස්තකාල මෑතක දී පිහිටවූ ශ්‍රී ලංකාව වැනි රටවල ජාතික පුස්තකාල සංකල්පය පිළිබඳ දැනුවත්භාවය වර්ධනය කිරීම අත්‍යවශ්‍ය වේ.

# දෙවන පරිච්ඡේදය

# ජාතික පුස්තකාලයක කාර්යයන්

ජාතික පුස්තකාලයක කාර්යභාරය කුමක් විය යුතු ද යන්න පිළිබඳ පුස්තකාලවේදීන් ගණනාවක් අදහස් ඉදිරිපත්කර ඇත. ලෝකයේ විවිධ රටවල ජාතික පුස්තකාල කාර්යයන් සකස් වී ඇත්තේ බොහෝ දුරට මෙම නිර්වචනයන් පදනම් කරගෙනයි. 1958 වර්ෂයේදී ජාතික පුස්තකාල කාර්යයන් පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා සමුළුවක් පවත්වන ලදී. ජාතික පුස්තකාල කාර්යයන් පිළිබඳ විග්‍රහයක් ඉදිරිපත් කළ පුස්තකාලවේදියෙක් වශයෙන් කේ. ඩබ්ලිව්. හම්ප්‍රීස් (K. W. Humpreys) හැඳින්විය හැකිය. හම්ප්‍රිස්ගේ විග්‍රහය අනුව ජාතික පුස්තකාලයක කාර්යයන් ප්‍රධාන වර්ග තුනක් යටතේ දක්වා ඇත.

1 මූලික කාර්යයන්
2 ඉටුකිරීමට සුදුසු කාර්යයන්
3 ජාතික පුස්තකාලයක් මගින් ඉටුකිරීමට අත්‍යවශ්‍ය නොවන වෙනත් කාර්යයන්

## මූලික කාර්යයන්

1 ජාතිය සතු ලිඛිත සාහිත්‍ය එක්රැස් කිරිම
2 නීත්‍යානුකූල තැන්පතු පිටපත් ලබා ගැනීම
3 විදේශ ප්‍රකාශන ලබාගැනීම
4 ජාතික ග්‍රන්ථ නාමාවලිය ප්‍රකාශයට පත් කිරීම
5 අනෙකුත් පුස්තකාලවල ප්‍රයෝජනය සඳහා සූචින් ප්‍රකාශයට පත් කිරිම

## ඉටු කිරීමට සුදුසු කාර්යයන්

1 අන්තර් පුස්තකාල පිරුළු සේවා
2 අත්පිටපත් එක්රැස් කිරිම
3 පුස්තකාල කටයුතු පිළිබඳ පර්යේෂණ පැවැත්වීම

## ජාතික පුස්තකාලයක් මගින් ඉටු කිරීමට අත්‍යවශ්‍ය නොවන වෙනත් කාර්යයන්

1 ජාත්‍යන්තර පොත් හුවමාරුව
2 පිටපත් (Duplicates) බෙදා හැරීම

හෙයින්ස් ගිටිං (Heinz Gitting) ජාතික පුස්තකාල කාර්යයන් පිළිබඳ විග්‍රහයක් ඉදිරිපත් කළ පුස්තකාලවේදියෙකි. ඔහුගේ විග්‍රහය ද හම්ප්‍රිස් ගේ විග්‍රහයට බොහෝ දුරට සමානය. ගිටිංගේ විග්‍රහයේදී ද ජාතික පුස්තකාල කාර්යයන් ප්‍රධාන වර්ග තුනක් යටතේ දක්වා ඇත.

1 මූලික කාර්යයන්
2 ඉටුකිරීමට සුදුසු කාර්යයන්
3 ජාතික පුස්තකාලයක් මගින් ඉටුකිරීම අත්‍යවශ්‍ය නොවන අනෙකුත් කාර්යයන්

## මූලික කාර්යයන්

1 ජාතියේ ලිඛිත සාහිත්‍ය එක්රැස් කිරීම
2 ප්‍රවර්තන හා සමුච්චිත ජාතික ග්‍රන්ථ නාමාවලි සම්පාදනය කිරීම

## ඉටු කිරීමට සුදුසු කාර්යයන්

1 වාරසඟරා ලිපි අනුක්‍රමණිකා හා පුවත්පත් ලිපි අනුක්‍රමණිකා සම්පාදනය කිරීම
2 ජාත්‍යන්තර පිරුළු මධ්‍යස්ථානය ලෙස කටයුතු කිරීම
3 ජාත්‍යන්තර ප්‍රකාශන හුවමාරු මධ්‍යස්ථානය වශයෙන් කටයුතු කිරීම

## ජාතික පුස්තකාලයක් මගින් ඉටු කිරීමට අත්‍යවශ්‍ය නොවන වෙනත් කාර්යයන්

1 ජාතික ඒකාබද්ධ සූචිය පවත්වාගෙන යාම

බ්‍රිතාන්‍ය ජාතික පුස්තකාලයේ බැහැර දෙන අංශයේ අධිපති මොරිස් බී ලයින් මහතා විසින් 1980 දී ජාතික පුස්තකාල කාර්යයන් පිළිබඳ විග්‍රහයක් ඉදිරිපත් කරන ලදී. මොරිස් බී ලයින් මහතා ජාත්‍යන්තර පුස්තකාල ක්ෂේත්‍රයේ පුළුල් අත් දැකීම් ඇති පුස්තකාලයාධිපතිවරයෙකි. ඔහු ජාතික පුස්තකාල කාර්යයන් ප්‍රධාන වර්ග තුනකට බෙදා විග්‍රහකර ඇත.

1 මූලික කාර්යයන්
2 මූලික කාර්යයන්වලින් මතුවන කාර්යයන්
3 ඉටුකළ හැකි වෙනත් කාර්යයන්

## මූලික කාර්යයන්

1 ජාතියේ තොරතුරු සම්පත්වල මධ්‍යම එකතුවක් පවත්වාගෙන යාම
2 පුළුල් විදේශ ප්‍රකාශන එකතුවක් පවත්වාගෙන යාම
3 අන්තර් පුස්තකාල පිරුළු සේවා සැලසුම් කිරීම හා සම්බන්ධීකරණය කිරීම
4 කාලීන හා පූර්වකාලීන ජාතික ග්‍රන්ථ නාමාවලි ප්‍රකාශයට පත් කිරීම
5 ජාතික ග්‍රන්ථ නාමාවලි මධ්‍යස්ථානය ලෙස කටයුතු කිරීම
6 පුස්තකාලවලින් ඉවත්කරනු ලබන පොත්පත්වල ජාතික තැන්පතු මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීම
7 ජාතික හා ජාත්‍යන්තර ප්‍රකාශන හුවමාරු මධ්‍යස්ථානය ලෙස කටයුතු කිරීම

## මූලික කාර්යයන්වලින් මතුවන කාර්යයන්

1 ජාතික පුස්තකාල සූචි ප්‍රකාශයට පත් කිරීම
2 පොත් ප්‍රදර්ශන පැවැත්වීම
3 පුස්තකාල ක්ෂේත්‍රයේ පර්යේෂණ පැවැත්වීම
4 පුස්තකාල කාර්ය මණ්ඩලය පුහුණු කිරීම
5 වෙනත් පුස්තකාලවලට තාක්ෂණික සහාය ලබා දීම

## ඉටු කළ හැකි වෙනත් කාර්යයන්

1 රටට අදාළ වෙනත් රටවල ප්‍රකාශයට පත්වන ප්‍රකාශන එක් රැස්කිරීම
2 දෘශ්‍යාබාධිත පාඨකයින් සඳහා පොත්පත් ලබාදීම

3 ජාතික වැදගත්කමක් හෝ ජාතික සබඳතාවක් ඇති වෙනත් අත්පිටපත් එක් රැස්කිරීම

සෞදි අරාබියේ ජෙඩා නගරයේ අබ්දුල් අසීස් විශ්වවිද්‍යාලයේ සහාය මහාචාර්යවරයෙකු වශයෙන් කටයුතු කළ මොහොමඩ් අල් නහරි මහතා විසින් ද ජාතික පුස්තකාල කාර්යයන් පිළිබඳ විග්‍රහයක් ඉදිරිපත් කර ඇත. ඔහු මෙම විග්‍රහය ඉදිරිපත් කරන ලද්දේ 1984 වර්ෂයේ දී ය. ජාතික පුස්තකාල රාශියක කාර්යයන් පිළිබඳ ඔහු අධ්‍යයනය කරන ලදි. අල්නහරි මහතා විසින් ද ජාතික පුස්තකාල කාර්යයන් ප්‍රධාන කොටස් තුනකට බෙදන ලදි.

1 පළමු ප්‍රමුඛතා කාර්යයන්
2 දෙවන ප්‍රමුඛතා කාර්යයන්
3 තෙවන ප්‍රමුඛතා කාර්යයන්

**පළමු ප්‍රමුඛතා කාර්යයන්**

- රටේ නීත්‍යානුකූල තැන්පතු පුස්තකාලය ලෙස කටයුතු කිරීම
- රට තුළ පළවන ප්‍රකාශනවල මධ්‍යම එකතුවක් පවත්වාගෙන යාම
- රට පිළිබඳ ලියවුන විදේශ කෘතීන් සහ රටේ කර්තෘවරුන් විසින් විදේශ රටවලදී ලියන ලද ග්‍රන්ථවල එකතුවක් පවත්වාගෙන යාම
- ජාතික ග්‍රන්ථ නාමාවලිය සම්පාදනය
- ජාතික ග්‍රන්ථ විඥාපන මධ්‍යස්ථානය ලෙස කටයුතු කිරීම

## දෙවන ප්‍රමුඛතා කාර්යයන්

- දේශීය අත්පිටපත් එකතු කිරීම සංරක්ෂණය හා සංවිධානය
- අනෙකුත් පුස්තකාලවලට ජාතික පුස්තකාල සූචියට ප්‍රවේශ පහසුකම් සැලසීම
- රටේ පුස්තකාල සේවා සැලසුම් කිරීම
- ජාතික හා අන්තර්ජාතික වශයෙන් ප්‍රකාශන හුවමාරු මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීම
- ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනය කිරීම

## තෙවන ප්‍රමුඛතා කාර්යයන්

- තොරතුරු හා විඥාපන සේවාවලට අදාළ ජාතික ප්‍රමිතීන් සකස් කිරීම
- අන්තර්ජාතික දත්ත එකතුවලට සම්බන්ධ වීමට අවශ්‍ය පහසුකම් සැලසීම
- විඥාපන විද්‍යා ක්‍රමවේදය පිළිබඳ පහසුකම් සැලසීම
- සූචි සේවාවන් පවත්වාගෙන යාම
- පුස්තකාල කටයුතු පිළිබඳ පර්යේෂණ පැවැත්වීම
- දෘශ්‍යාබාධිත හා අනෙකුත් ආබාධිත අය සඳහා සේවා ලබාදීම

ලෝකයේ සෑම රටකම ජාතික පුස්තකාලවල කාර්යයන් සකස් කරගෙන ඇත්තේ ජාතික පුස්තකාල කාර්යයන් පිළිබඳ ඉහත සඳහන් විග්‍රහයන් පදනම් කරගෙනය. කෙසේ වුව ද වෙනස්වන තොරතුරු සමාජය තුළ ජාතික පුස්තකාලවල කාර්යභාරය කුමක් විය යුතු ද යන කරුණ සංවාදයට භාජනය වී තිබේ. වෙනස්වන සමාජය තුළ

ජාතික පුස්තකාල වල කාර්යභාරය පිළිබඳ ජාත්‍යන්තර සමුළුවක් 2005 වර්ෂයේ දී තායිලන්තයේ බැංකොක් නුවර පවත්වන ලදී. දැනුම පාදක කරගත් වර්තමාන සමාජය තුළ ජාතික පුස්තකාලවල කාර්යභාරය පිළිබඳව මෙම සමුළුවේදී පුළුල් වශයෙන් සාකච්ඡා විය.

යුනෙස්කෝ ප්‍රකාශනයකට අනුව ජාතික පුස්තකාලයක වගකීම අනාගත පරම්පරාවේ ප්‍රයෝජනය සඳහා රටතුළ ඇති ග්‍රන්ථ සම්භාරය ඒකරාශි කිරීම හා සංරක්ෂණය කිරීම වේ. ජාතික පුස්තකාලයක කාර්යභාරය පිළිබඳව අදහස් විශාල වශයෙන් ඉදිරිපත් වී ඇත. මේ පිළිබඳව ලිපි ලේඛන ද රාශියක් සම්පාදනය වී ඇත සම්මන්ත්‍රණ ද ගණනාවක් පවත්වා ඇත. මෙම සම්මන්ත්‍රණවලින් බොහෝමයක් පවත්වා ඇත්තේ යුනෙස්කෝ ආයතනයේ අනුග්‍රහය ඇතිවය.

සෑම ජාතික පුස්තකාලයක් විසින්ම ලෝකයේ අනෙකුත් ජාතික පුස්තකාල සමග සහයෝගීතාව වර්ධනය කරගැනීම ද අත්‍යවශ්‍ය කාර්යයකි. එමෙන් ම පුස්තකාල ක්ෂේත්‍රයේ අනෙකුත් ජාත්‍යන්තර සංවිධාන සමග ද සහයෝගිතාව පවත්වාගෙන යා යුතු වේ. එමෙන් ම ජාත්‍යන්තර තොරතුරු පද්ධතිවලට හැකිතාක් දුරට සම්බන්ධ විය යුතුය යන්න විශේෂඥ මතය වේ. රටේ ජාතික සංවර්ධනය සඳහා දායක වීම ද ජාතික පුස්තකාලයක කාර්යයක් වේ. දේශපාලන නායකයින්, සැලසුම්කරුවන්, පරිපාලකයින්, ආර්ථික විද්‍යාඥයින්, අධ්‍යාපනඥයින් හා විද්‍යාඥයින් වැනි ජාතික සංවර්ධනය සඳහා දායක වන්නන්ට සේවා සැපයීමට ජාතික පුස්තකාලයක් ඍජුව හෝ වක්‍ර ආකාරයෙන් කටයුතු කළ යුතු වේ. 1960 ගණන්වල දී සංවර්ධනය මනිනු ලැබුවේ ආර්ථිකමය සාධක අනුව පමණි. නමුත් වර්තමානයේ සංවර්ධනය මැනීම සඳහා ආර්ථික සාධක මෙන් ම

සමාජ සංස්කෘතික අධ්‍යාපනික සාධක ද සැලකිල්ලට ගනු ලැබේ. එහිදී තොරතුරුවලට ද විශේෂ වැදගත්කමක් හිමි වේ. සංවර්ධනය සඳහා තොරතුරු සැපයීමේ දී තොරතුරු අවශ්‍යතා, තොරතුරු භාවිත කරන්නන් හා තොරතුරු සම්පත් හඳුනාගත යුතු වේ.

ජාතික පුස්තකාලයක ප්‍රධාන අරමුණ රටතුළ පළවන ප්‍රකාශන සම්භාරය ඒකරාශි කර ආරක්ෂා කිරීම බැවින් ජාතික එකතුවේ පොත් බැහැරදීමක් සිදුනොකරන අතර විමර්ශන පුස්තකාල ලෙස පමණක් පවත්වාගෙන යාම සම්ප්‍රදාය වේ. එසේ බැහැර දීමක් සිදු නොකරන නිසා පුළුල් ඡායාපිටපත් සේවයක් පවත්වාගෙන යා යුතුවේ. එසේ ඡායාපිටපත් ලබාගැනීම සඳහා පොත් නිතර නිතර භාවිත කිරීම නිසා පොත්වලට හානි සිදුවේ. එබැවින් ඡායාපිටපත් අවශ්‍යතා සඳහා සෑම පොතකම අමතර පිටපතක් තබා ගැනීම අවශ්‍ය වේ.

ජාතික පුස්තකාලයකින් අපේක්ෂා කරන තවත් වැදගත් කාර්යයක් නම් රටේ පුස්තකාල පද්ධතියට නායකත්වය හා මගපෙන්වීම ලබාදීමයි. ජාතික පුස්තකාලයක් නොමැතිව රටක සතුටුදායක පුස්තකාල පද්ධතියක් ගොඩ නැගීය නො හැකිය. රටේ පුස්තකාල පද්ධතියේ මනා ක්‍රියාකාරීත්වයට හා ගැටලු නිරාකරණයට අදාළ ක්‍රියාමාර්ග ගැනීමට කාලානුරූපව ජාතික පුස්තකාලයක් විසින් කටයුතු කළ යුතුවේ. රටේ පුස්තකාල පද්ධතියේ සංවර්ධනය හා ගුණාත්මකභාවය ඇතිකිරීම සම්බන්ධයෙන් ජාතික පුස්තකාලයට වගකීමක් ඇත. එමෙන්ම රටේ පුස්තකාලයාධිපතිත්වයේ ප්‍රවර්ධනය සඳහා අවශ්‍යවන ක්‍රමවිද්‍යාත්මක කටයුතු ද (methodological activities) ජාතික පුස්තකාලයක් විසින් ඉටු කළ යුතුය. රටේ පුස්තකාලයාධිපතිත්වය සම්බන්ධයෙන් විවිධ පර්යේෂණ මගින් අනාවරණය කර ගන්නා කරුණු අනුව මෙම ක්‍රම විද්‍යාත්මක කටයුතු ක්‍රියාත්මක කළ යුතුය.

මීට අමතරව රටතුළ පවතින වාචික සම්ප්‍රදාය (Oral tradition) හ දේශීය දැනුම (Indigenous knowledge) ඒකරාශී කිරීම ද ජාතික පුස්තකාලයේ වගකීමක් වේ. මුද්‍රිත මාධ්‍යයට ඇතුළත් නොවූ වාචික සම්ප්‍රදායේ පවතින තොරතුරු සම්භාරයක් රටතුළ පවතී. උදාහරණ වශයෙන් ජනකවි, ජන කතා, ජනගී, පූදපූජා, සිරිත්විරිත්, ශාන්තිකර්ම, ජන නාට්‍ය ආදි වශයෙන් වාචික සම්ප්‍රදාය තුළ පවතින සංස්කෘතික උරුමය ඒකරාශි කිරීම ද ජාතික පුස්තකාලයක් විසින් ඉටුකළ යුතුය.

වර්තමානයේ ප්‍රකාශන සඳහා ප්‍රමිති අංක ලබාදීම සිදුකෙරේ. මේ යටතේ අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංකය (ISBN), අන්තර්ජාතික ප්‍රමිති මාලික අංක (ISSN) හා අන්තර්ජාතික ප්‍රමිති සංගීත අංක (ISMN) මේ යටතේ ලබාදේ. මෙය ජාත්‍යන්තර ව්‍යාපෘතියක් වන අතර කිසියම් රටක ප්‍රමිති අංක ලබාදීමේ මධ්‍යස්ථානය වශයෙන් කටයුතු කරන්නේ ජාතික පුස්තකාලයයි.

එමෙන්ම තොරතුරු ලබා ගැනීම සඳහා පාඨකයින් විවිධ ආයතන හෝ තොරතුරු මධ්‍යස්ථාන වෙත යොමු කිරීමේ යොමුගත මධ්‍යස්ථානය (referrel centre) වශයෙන් ද ජාතික පුස්තකාලය කටයුතු කළ යුතු වේ. ජාතික පුස්තකාලය රටක පුස්තකාලයාධිපතිත්වයේ කේන්ද්‍රය (hub) වන අතර ජාතික පුස්තකාලය රටේ අනෙකුත් පුස්තකාල සංවර්ධනය කරා යොමු කරවිය යුතුය. එමෙන්ම ජාතික හා පුද්ගල මට්ටමින් ආර්ථික හා සමාජ සංවර්ධනය පහසුකිරීම සඳහා අවශ්‍යවන තොරතුරු පද්ධති ඇති කළ යුතුය. මීට අමතරව මුද්‍රිත නොවන තොරතුරු සම්පත්වල (non-print) ජාතික සම්පත් මධ්‍යස්ථානය වශයෙන්ද කටයුතු කළ යුතුය. එමෙන්ම රටක පුස්තකාල ක්ෂේත්‍රයේ පර්යේෂණ පිළිබඳ මධ්‍යම සම්බන්ධීකරණ මධ්‍යස්ථානය වශයෙන් ද ජාතික පුස්තකාලය

කටයුතු කරයි. එමෙන්ම ආබාධිත අය සඳහා තොරතුරු ලබාදීමේ ජාතික සේවාවන් ද ජාතික පුස්තකාලයක් පවත්වාගෙන යා යුතුය. රටතුළ පවතින තොරතුරු සම්පත් සම්භාරය සංරක්ෂණය කිරීම ද ජාතික පුස්තකාලයක කාර්ය භාරයකි. ජාතික පුස්තකාලය සතු තොරතුරු සම්පත් මෙන්ම රටේ අනෙකුත් පුස්තකාලවල සම්පත් සංරක්ෂණය සඳහා සහාය වීමද ජාතික පුස්තකාලයක වගකීමකි. ජාතික පුස්තකාලයක සම්පත් සංරක්ෂණය සඳහා පොත් බැදීම ධූමායනය (fumigation), නිරාම්ලීකරණය (deacidification), ආර්ද්‍රතා පාලනය (humidity control) වැනි ක්‍රම මෙන්ම සංඛ්‍යාංක කරණය (digitization) වැනි නවීන ක්‍රම ද උපයෝගී කරගනු ලැබේ. එමෙන්ම රටේ අනෙකුත් පුස්තකාලවල තොරතුරු සම්පත් සංරක්ෂණය සඳහා උපදෙස් ලබාදීම හා පුස්තකාල කාර්යමණ්ඩල පුහුණු කිරීම කළ යුතුය.

ජාතික පුස්තකාල කටයුතු හා රටේ අනෙකුත් පුස්තකාලවල කාර්යයන් සඳහා තොරතුරු තාක්ෂණය උපයෝගී කරගැනීම ද වෙනස්වන තොරතුරු සමාජය තුළ ජාතික පුස්තකාලයක වගකීමක් වේ. එහිදී රටේ අනෙකුත් පුස්තකාලවල තොරතුරු තාක්ෂණය උපයෝගිකරගැනීමට අදාළව උපදෙස් ලබාදීම පුස්තකාල කටයුතු සඳහා මෘදුකාංග නිෂ්පාදනය පරිගණක ජාල සම්බන්ධතා ගොඩනැගීම (networking) ආදී කාර්යයන් ඉටු කළ යුතු වේ.

# තුන්වන පරිච්ඡේදය

# ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

## ආරම්භය

ලෝකයේ අනෙකුත් රටවල් සමග සසඳන විට ශ්‍රී ලංකාවේ ජාතික පුස්තකාලය පිහිටුවීම ප්‍රමාද වී ඇත. ඉන්දියාව තායිලන්තය වැනි රටවල ජාතික පුස්තකාල පිහිටුවා ඇත්තේ වසර සියයකට පමණ පෙරය. ශ්‍රී ලංකාව සඳහා ජාතික පුස්තකාලයක් පිහිටුවීමේ අවශ්‍යතාවය 1960 දශකය තුළ සාකච්ඡාවට භාජනය වී ඇත. විවිධ විද්වතුන් හා කොමිෂන් සභා විසින් මේ පිළිබඳව කරුණු ඉදිරිපත් කර ඇත. චොක්සි කොමිසම (1955), කන්දයියා කමිටුව (1959), විල්මට් ඒ පෙරේරා කමිටුව (1960) මෙසේ කරුණු ඉදිරිපත් කළ කොමිෂන් සභා වේ. එමෙන්ම 1967 දී කොළඹ දී පවත්වන ලද යුනෙස්කෝ ජාතික පුස්තකාල විශේෂඥයින්ගේ රැස්වීමේ දී ද ශ්‍රී ලංකාවේ ජාතික පුස්තකාලයක් පිහිටුවීමේ අවශ්‍යතාව සාකච්ඡා කර ඇත. එව්ලින් ඉජ්. එවන්ස් මහත්මිය (E. J. Evans) 1967-1970 කාලය තුළ යුනෙස්කෝ පුස්තකාල උපදේශිකාවක් ලෙස ශ්‍රී ලංකාවේ කටයුතු කර ඇත. ඒ මහත්මිය ද මේ සම්බන්ධයෙන් උපදෙස් ලබා දී ඇත. මෙම සිදුවීම්වල ප්‍රතිඵලයක් වශයෙන් 1970 වර්ෂයේ දී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය පිහිටුවන ලදී. ශ්‍රී ලංකාවේ ජාතික පුස්තකාලයක් පිහිටුවීමේ හා පවත්වාගෙන යාමේ වගකීම මෙම මණ්ඩලයට පැවරිණි. ඒ අනුව ජාතික පුස්තකාලය පිහිටුවීමේ මූලික කටයුතු මණ්ඩලය විසින් ආරම්භ කරන ලදී. ඒ යටතේ ජාතික පුස්තකාල එකතුව ගොඩනැගීම, ගොඩනැගිල්ලක් ඉදිකිරීම, කාර්ය මණ්ඩල බඳවා ගැනීම මණ්ඩලය මගින් සිදු කරන ලදී. ඒ අනුව 1990 වර්ෂයේ ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය ආරම්භ කිරීමට

හැකි විය. 1990 අප්‍රේල් 27 දින එවකට ජනාධිපතිව සිටි රණසිංහ ප්‍රේමදාස මැතිතුමා විසින් ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය විවෘත කරන ලදී.

1970 ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩල පනත 1998 වර්ෂයේදී නව පනතක් වශයෙන් ඉදිරිපත් කරන ලදී. නව පනත අනුව ආයතනයේ නාමය ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය වශයෙන් නම් කෙරිණි. නව පනත මගින් වඩා පුළුල් බලතල මණ්ඩලයට ලැබුණු අතර අධ්‍යක්ෂ මණ්ඩලය ද වඩා ශක්තිමත් විය. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය හෙවත් ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය ද නව පනත මගින් ස්ථාපිත කරන ලදී.

## ආයතනික ව්‍යුහය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් පාලනය වන අතර අධ්‍යක්ෂ මණ්ඩලය නිල බලයෙන් පත්වන සාමාජිකයින් හත් දෙනෙකුගෙන් ද අධ්‍යාපන අමාත්‍යවරයා පත් කරන සාමාජිකයින් හත් දෙනෙකුගෙන් ද සමන්විත වේ.

නිල බලයෙන් පත්වන සාමාජිකයින් පහත සඳහන් පරිදි වේ.

1. අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්
2. සංස්කෘතික අමාත්‍යයේ ලේකම්
3. රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්
4. ශ්‍රී ලංකා තොරතුරු සන්නිවේදන තාක්ෂණ ආයතනයේ සභාපති
5. ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සභාපති
6. ජාතික විද්‍යා පදනමේ සභාපති

## 7 මහා භාණ්ඩාගාරයේ නියෝජිතයෙක්

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය හෙවත් ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වේ. මණ්ඩලයේ ප්‍රධානියා සභාපති වරයා වන අතර අධ්‍යක්ෂ ජනරාල් වරයා ප්‍රධාන විධායක නිලධාරියා වේ. මණ්ඩලයේ අංශ සංඛ්‍යාව 14 ක් වන අතර ඉන් අංශ 6 ක් ජාතික පුස්තකාලයට අයත් අංශ වේ. ජාතික පුස්තකාලයට අයත් අංශ පහත සඳහන් පරිදි වේ.

1 ප්‍රතිග්‍රහණ අංශය
2 පාඨක සේවා අංශය
3 ග්‍රන්ථ විඥාපන පාලන අංශය
4 තොරතුරු තාක්ෂණ අංශය
5 සංරක්ෂණ අංශය
6 පුස්තකාල පර්යේෂණ අංශය

මණ්ඩලය යටතේ ඇති අනෙකුත් අංශ පහත සඳහන් පරිදි වේ.

1 ව්‍යාප්ති සේවා අංශය
2 පුස්තකාල සහයෝගිතා අංශය
3 පුස්තකාල අධ්‍යාපන හා පුහුණු අංශය
4 ප්‍රකාශන හා ග්‍රන්ථ සංවර්ධන අංශය
5 කළමනාකරණ හා ක්‍රමෝපායන සැලසුම් අංශය
6 පරිපාලන අංශය
7 මුදල් හා සැපයුම් අංශය
8 අභ්‍යන්තර විගණන අංශය
9 නඩත්තු හා උපයෝගිතා අංශය

# උපදේශක කමිටු

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ විවිධ අංශවල කටයුතු මනාව පවත්වාගෙන යාම සඳහා උපදෙස් ලබා ගැනීමට උපදේශක කමිටු පත් කර ඇත. මණ්ඩලයේ නිර්දේශය අනුව අධ්‍යාපන අමාත්‍යවරයා විසින් මෙම කමිටු පත්කරනු ලැබේ.

ජාතික පුස්තකාලයට අදාළ උපදේශක කමිටු පහත සඳහන් පරිදි වේ.

1 ජාතික පුස්තකාල උපදේශක කමිටුව
2 ග්‍රන්ථ විඥාපන සේවා උපදේශක කමිටුව
3 සංරක්ෂණ උපදේශක කමිටුව
4 තොරතුරු තාක්ෂණ උපදේශක කමිටුව
5 පුස්තකාල පර්යේෂණ උපදේශක කමිටුව

මණ්ඩලයේ අනෙක් අංශවලට අදාළ උපදේශක කමිටු

1 පුස්තකාල සංවර්ධන උපදේශක කමිටුව
2 ප්‍රකාශන උපදේශක කමිටුව

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ප්‍රධානියා සභාපති වරයා වන අතර සභාපතිවරයා යටතේ ප්‍රධාන විධායක නිලධාරියා වන අධ්‍යක්ෂ ජනරාල්වරයා කටයුතු කරයි. අධ්‍යක්ෂ ජනරාල්වරයා යටතේ අධ්‍යක්ෂවරු තිදෙනෙක් සිටින අතර ඉන් දෙදෙනෙක් වෘත්තිය අධ්‍යක්ෂවරුන් වන අතර අනෙක් අධ්‍යක්ෂවරයා මුදල් හා පාලන කටයුතු භාරව කටයුතු කරයි. වෘත්තිය අධ්‍යක්ෂවරු දෙදෙනාගෙන් එක් අයෙකු ජාතික පුස්තකාලය භාරව කටයුතු කරන

අතර අනෙක් අධ්‍යක්ෂවරයා ජාතික මට්ටමේ පුස්තකාල සංවර්ධන කටයුතු භාරව කටයුතු කරයි. අධ්‍යක්ෂවරු යටතේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරු ද නියෝජ්‍ය අධ්‍යක්ෂවරු යටතේ සහකාර අධ්‍යක්ෂවරු ද සහකාර අධ්‍යක්ෂවරු යටතේ පුස්තකාල හා ප්‍රලේඛන නිලධාරීහු ද කටයුතු කරති.

## කාර්යයන්

1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනත අනුව ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ කාර්යයන් හා ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ කාර්යයන් වෙන වෙනම දක්වා ඇත.

ඒ අනුව ශ්‍රී ලංකා ජාතික පුස්ත්කාලයේ කාර්යයන් පහත පරිදි වේ.

1 සියලුම ජන කොටස්වල භාවිතය සඳහා ඔවුන්ගේ අවශ්‍යතාවලට උචිත පුස්තකාල හා ප්‍රලේඛන සම්පත් පිළිබඳ ජාතික සංචිතයක් ගොඩනැගීම

2 ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ප්‍රකාශයට පත් කරන ලද ජාතික පුස්තකාල හා ප්‍රලේඛන ද්‍රව්‍ය සංචිතයක් පිහිටුවීම වැඩි දියුණු කිරීම හා පවත්වාගෙන යාම මගින් ශ්‍රී ලංකාවේ ජාතික හා සංස්කෘතික උරුමය සංරක්ෂණය කිරීම

3 මුද්‍රණකරුවන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනත යටතේ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ තැන්පත් කරන ලද ශ්‍රී ලංකා ප්‍රකාශනවල පිටපත් ලබා ගැනීම

4 ශ්‍රී ලංකාව තුළ හෝ ඊට අදාළව ප්‍රකාශයට පත් කරන ලද ප්‍රකාශනවල හෝ ශ්‍රී ලංකාවේ අවශ්‍යතාවලට අදාළ විදේශීය ප්‍රකාශනවල පිටපත් මිලට ගැනීම හෝ අන්‍යාකාරයකින් ලබා ගැනීම

5 ජාතික ග්‍රන්ථ විඥාපන සේවාවක් සහ ශ්‍රී ලංකාවේ පුස්තකාලවල තැන්පත් වී ඇති පුස්තකාල ද්‍රව්‍ය පිළිබඳ ඒකාබද්ධ සූචින් සම්පාදනය ඇතුළු ග්‍රන්ථ විඥාපන සේවා සැපයීම

6 ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ප්‍රකාශයට පත්කරන ලේඛන හා ප්‍රකාශනවල ජාතික ග්‍රන්ථ විද්‍යා දත්ත සැකසුම් පිහිටුවීම හා ඇති කිරීම

7 ශ්‍රී ලංකාවේ ජාතික ග්‍රන්ථ නාමාවලිය ප්‍රකාශයට පත් කිරීම

8 ශ්‍රී ලංකාවේ සියලු ජන කොටස්වලට තොරතුරු යොමු කිරීම් සේවා හා පර්යේෂණ සේවා සැපයීම

9 ප්‍රජාවේ සියලු සාමාජිකයින්ට ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටතදී ලබාගත හැකි හෝ අනාගතයේදී ලබාගත හැකි පුස්තකාල හා ප්‍රලේඛන සම්පත්වලට ප්‍රවේශ පහසුකම් සැලසීම

10 ශ්‍රී ලාංකික ප්‍රජාවේ සියලු කොටස්වලට සේවය කරන මහජන පාසල් ශාස්ත්‍රීය ආණ්ඩුවේ සහ වෙනත් පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථාන ජාලය ද ඇතුළුව පුස්තකාල හා ප්‍රලේඛන ජාල පිහිටුවීම වැඩි දියුණු කිරීම හා පවත්වාගෙන යාම ප්‍රවර්ධනය කිරීම ඒ සඳහා උපදෙස් දීම හා සහාය වීම

11 පුස්තකාල ද්‍රව්‍ය හුවමාරු කරගැනීම පුස්තකාල අතර බැහැර දීම හා ලේඛන පිටපත් කිරිම හා කාර්ය මණ්ඩලය පුහුණු කිරීම හා හුවමාරු කර ගැනීමද ඇතුළුව ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථාන අතර සහයෝගීතාව හා සම්පත් බෙදා ගැනීම ප්‍රවර්ධනය කිරීම හා පහසු කරලීම

## ජාතික පුස්තකාලයේ ප්‍රතිග්‍රහණ ප්‍රතිපත්තිය

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ අරමුණ වන්නේ ප්‍රතිග්‍රහණ ප්‍රතිපත්තියේ අරමුණ වන්නේ නම් ශ්‍රී ලංකාවේ සමස්ත ප්‍රකාශන හා ලේඛන සම්භාරය අත්පත් කර ගැනීමයි. ඒ යටතේ ශ්‍රී ලංකාව තුළ ප්‍රකාශයට පත් කෙරෙන පොත්, පුවත්පත්, සඟරා වාර්තා, ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය, විද්‍යුත් මාධ්‍ය, පුස්කොල පොත්, අත්පිටපත්, සූක්ෂම සේයාපට, ගැසට්, හැන්සාඩ් වාර්තා, සිතියම්, ඡායාරූප, පත්‍රිකා ආදි සියලුම ග්‍රන්ථ හා ලේඛන අත්පත්කර ගැනේ.

වත්මන් ප්‍රතිග්‍රහණ ප්‍රතිපත්තියට අනුව පහත සඳහන් ප්‍රකාශන ලබාගැනීම කෙරෙහි ප්‍රමුඛතාව දක්වනු ලැබේ.

1 ශ්‍රී ලංකාව පිළිබඳ ප්‍රකාශන
2 ශ්‍රී ලංකාව තුළ පළවන ප්‍රකාශන
3 ශ්‍රී ලාංකිකයින් විසින් පලකරන ප්‍රකාශන
4 විදේශ රටවල පළවන ශ්‍රී ලංකාව පිළිබඳ ප්‍රකාශන
5 විදේශ රටවල සිටින ශ්‍රී ලාංකිකයින් පළකරන ප්‍රකාශන
6 පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ ප්‍රකාශන

## ජාතික පුස්තකාල එකතු

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය එකතු ගණනාවකින් සමන්විත වේ ඒවා පහත සඳහන් පරිදිවේ.

1 ශ්‍රී ලංකා එකතුව
2 නීත්‍යානුකූල තැන්පතු එකතුව
3 පුවත්පත් එකතුව
4 වාර සඟරා එකතුව
5 රජයේ ප්‍රකාශන එකතුව
6 විදේශ එකතුව
7 විමර්ශන එකතුව
8 විද්‍යුත් මාධ්‍ය එකතුව
9 සූක්ෂම සේයාපට එකතුව
10 සිතියම් එකතුව
11 පශ්චාත් උපාධි නිබන්ධන එකතුව
12 පුස්තකාල හා විඥාපන විද්‍යා එකතුව
13 අශ්පර්ශනීය සංස්කෘතික උරුමය පිළිබඳ එකතුව

14 යුනෙස්කෝ ප්‍රකාශන එකතුව
15 ජනසාහිත්‍ය එකතුව
16 පුස්කොල පොත් එකතුව
17 දුර්ලභ පොත් එකතුව

විද්වතුන්ගේ එකතුන්

1 මාර්ටින් වික්‍රමසිංහ එකතුව
2 කේ ජයතිලක එකතුව
3 ආචාර්ය එම්. එච්. පීටර්සිල්වා එකතුව
4 මහාචාර්ය ටිකිරි අබේසිංහ එකතුව
5 මහාචාර්ය ඩී. ඊ. හෙට්ටිආරච්චි එකතුව
6 ආචාර්ය ඊ. එම්. විජේරාම එකතුව
7 තේජා ගුණවර්ධන එකතුව
8 ආචාර්ය පී. බී. සන්නස්ගල එකතුව

විදේශ තොරතුරු කවුළු

1 චීන කවුළුව
2 ඉරාන කවුළුව

## මාර්ටින් වික්‍රමසිංහ ජන ජීවිතය ලේඛන කලාගාරය

හෙලයේ මහා ගත්කරු නමින් හැඳින්වෙන මාර්ටින් වික්‍රමසිංහ ශූරීන් පිළිබඳ කෞතුකාගාරයක් ජාතික පුස්තකාලය තුළ පවත්වාගෙන යනු ලැබේ. මෙය ජාතික පුස්තකාලයට ලබාදෙන ලද්දේ මාර්ටින් වික්‍රමසිංහ භාරකාර මණ්ඩලය විසිනි. මෙම කෞතුකාගාරය තුළ

මාර්ටින් වික්‍රමසිංහ ශූරීන් පරිහරණය කරන ලද පොත් පත් දහසක් පමණ තැන්පත් කර ඇත. මීට අමතරව එතුමන් පරිහරණය කළ ලියන මේසය, පුටු, යතුරුලියන යන්ත්‍ර, පෑන්, අස් කණ්නාඩි, හාන්සි පුටු හා වෙනත් විවිධ කෞතුක භාණ්ඩ තැන්පත් කර ඇත. එමෙන්ම එතුමන් විසින් රචනා කරන ලද සියයක් පමණ වූ ග්‍රන්ථ සම්භාරයද මෙහි තැන්පත් කර ඇත. මෙය පාසල් සිසුන් හා සාමාන්‍ය පාඨකයින් ඉතා කැමැත්තෙන් නරඹන ස්ථානයකි.

ජාතික පුස්තකාලය පවත්වාගෙන යන සේවාවන් පහත සඳහන් පරිදි වේ.

1. විමසීම් සේවය
2. විමර්ශන සේවය
3. අන්තර් පුස්තකාල පිරුළු සේවය
4. වරණීය තොරතුරු සමුද්ධරණ සේවය
5. ප්‍රවර්තන සාවධාන සේවය
6. ඡායා පිටපත් සේවය
7. පාඨක අධ්‍යාපන සේවය
8. තොරතුරු ප්‍රති ඇහිරීමේ සේවය
9. අන්තර්ජාල සේවය

## ග්‍රන්ථ විඥාපන සේවා

ජාතික මට්ටමින් ග්‍රන්ථ විඥාපන සේවා පවත්වාගෙනයාම ජාතික පුස්තකාලයට පැවරෙන වගකීමකි. ග්‍රන්ථ විඥාපන සේවා යනු රටතුළ පලවන ප්‍රකාශන පුස්තකාල විද්‍යානුකූලව ලේඛන ගත කර පාඨක ප්‍රයෝජනය සඳහා ලබා දීමයි. මේ යටතේ ජාතික මට්ටමේ ග්‍රන්ථ විඥාපන සේවා ගණනාවක් ජාතික පුස්තකාලය පවත්වාගෙන

යනු ලැබේ. ඉන් ප්‍රධාන සේවාවක් ලෙස ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය (Sri Lanka National Bibliography) සම්පාදනය හැඳින්විය හැකිය. ජාතික ග්‍රන්ථ නාමාවලිය යනු රටතුළ පළවන ප්‍රකාශන පිළිබඳ නිල ලේඛනයවේ. ජාතික ග්‍රන්ථ නාමාවලිය සම්පාදනය කිරීමේ වගකීම පැවරෙනුයේ ජාතික පුස්තකාලයටයි. ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය දැනට මාසිකව පළකෙරේ. මෙහි ඇතුළත් පොත් පිළිබඳ තොරතුරු විෂය අනුව වර්ග කර ඇත. රටතුළ පළවන නව ග්‍රන්ථ පිළිබඳ තොරතුරු ලබා ගත හැකි එකම නිල ලේඛනය මෙය වේ.

ජාතික පුස්තකාලය පවත්වාගෙන යන තවත් ග්‍රන්ථ විඥාපන සේවාවක් ලෙස පූර්වකාලීන ජාතික ග්‍රන්ථ නාමාවලිය හැඳින්විය හැකිය. ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය සම්පාදනය ආරම්භ වූයේ 1962 වර්ෂයේදීය. ඒ අනුව ජාතික ග්‍රන්ථ නාමාවලියට ඇතුළත් වනුයේ 1962 සිට වර්තමානය දක්වා පලවූ ප්‍රකාශන වේ.

ඒ අනුව ශ්‍රී ලංකාවේ මුද්‍රණ කර්මාන්තයේ ආරම්භයේ සිට ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය ආරම්භ කළ 1962 වර්ෂය දක්වා පලවූ පැරණි ප්‍රකාශන පිළිබඳ තොරතුරු ඇතුළත් කර පූර්වකාලීන ජාතික ග්‍රන්ථ නාමාවලිය (Retrospective National Bibliography) සම්පාදනය කෙරේ.

මීට අමතරව වාරසඟරා ලිපි අනුක්‍රමණිකාව (Periodical Article Index) ද තවත් ග්‍රන්ථ විඥාපන සේවාවකි. ශ්‍රී ලංකාවේ පලවන සඟරාවල ලිපි පිළිබඳ තොරතුරු ඇතුළත් කර වාරසඟරා ලිපි අනුක්‍රමණිකාව සම්පාදනය කෙරේ.

# ප්‍රලේඛන සේවා

විවිධ පුස්තකාලවල හෝ වෙනත් ආයතනවල විසිරී ඇති ප්‍රකාශන පිළිබඳ තොරතුරු එක්රැස්කර පාඨකයින්ට එම ප්‍රකාශන පහසුවෙන් සොයාගත හැකි ආකාරයට සංවිධානය කිරීම ප්‍රලේඛන සේවාවක අරමුණ වේ.

ජාතික මට්ටමේ ප්‍රලේඛන සේවා පවත්වා ගෙන යාම ද ජාතික පුස්තකාලයකට පැවරෙන වගකීමකි. ඒ අනුව ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය ද ජාතික මට්ටමේ ප්‍රලේඛන සේවා ගණනාවක් පවත්වාගෙන යනු ලැබේ. ප්‍රලේඛන සේවාවක ප්‍රධාන ප්‍රයෝජනය පාඨකයාගේ කාලයත් ශ්‍රමයත් ඉතිරිකර අවශ්‍ය තොරතුරු පහසුවෙන් සොයා ගත හැකි වීමයි.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය සම්පාදනය කරන ජාතික මට්ටමේ ප්‍රලේඛන මූලාශ්‍ර පහත පරිදි වේ.

1 ජාතික ඒකාබද්ධ සූචිය
2 පශ්චාත් උපාධි නිබන්ධන අනුක්‍රමණිකාව
3 ශ්‍රී ලංකා පුවත්පත් ලිපි අනුක්‍රමණිකාව
4 රජයේ ප්‍රකාශන නාමාවලිය
5 ශ්‍රී ලංකාවේ පර්යේෂණ වාර්තා පිළිබඳ අනුක්‍රමණිකාව
6 ශ්‍රී ලංකා සමුළු අනුක්‍රමණිකාව
7 විශේෂ ග්‍රන්ථ නාමාවලී

## සංරක්ෂණ කටයුතු

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ සංරක්ෂණ කටයුතු ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදිය හැකිය එනම් ජාතික පුස්තකාල එකතුව සංරක්ෂණය කිරීම හා ජාතික මට්ටමේ සංරක්ෂණ කටයුතු වශයෙනි. ජාතික පුස්තකාලයේ සංරක්ෂණ කටයුතු යටතේ පොත් බැඳීම, ලේඛන සංරක්ෂණය, ධූමායනය, දූවිලි පිස දැමීම, උෂ්ණත්වය හා ආර්ද්‍රතාව මානාව පවත්වාගෙන යාම ආදි කටයුතු සිදු කෙරේ.

ජාතික මට්ටමේ සංරක්ෂණ කටයුතු යටතේ සංරක්ෂණ කටයුතු පිළිබඳව වෙනත් පුස්තකාලවලට උපදෙස් දීම, සංරක්ෂණ කටයුතු පිළිබඳ පාඨමාලා පැවැත්වීම, පොත්බැඳුම් ද්‍රව්‍ය අලෙවි කිරීම වැනි කාර්යයන් ඉටු කෙරේ. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ සහාය ඇතිව දිවයිනේ ප්‍රධාන මහජන පුස්තකාල ආශ්‍රිතව සංරක්ෂණ මධ්‍යස්ථාන 127 ක් පිහිටුවා ඇති අතර ඒවායේ කටයුතු පසු විපරම් කිරීම හා සහාය වීමද දැනට සිදු කෙරේ.

## තොරතුරු තාක්ෂණ කටයුතු

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ කටයුතු රාශියක් දැනට පරිගණක ගත කර ඇත. ජාතික පුස්තකාල සූචිය, ජාතික ඒකාබද්ධ සූචිය, ප්‍රලේඛන සේවා ප්‍රතිග්‍රහණ කටයුතු, කාර්යාල කටයුතු ආදි කාර්යයන් රාශියක් පරිගණක ගත කර ඇත. ආයතනයේ අංශ එකිනෙක සම්බන්ධ කරමින් අභ්‍යන්තර ජාලයක් (Local Area Network) පිහිටුවා ඇත. තොරතුරු තාක්ෂණ අංශයක් පිහිටුවා ඇති අතර තොරතුරු තාක්ෂණ උපදේශක කමිටුවක් ද පත්කර ඇත. ජාතික පුස්තකාල වෙබ් අඩවියට (www.natlib.lk) ආයතනය පිළිබඳ තොරතුරු හා ප්‍රධාන දත්ත පදනම් ඇතුළත් කර ඇත. වෙනත්

පුස්තකාලවල තොරතුරු තාක්ෂණ කටයුතු සම්බන්ධයෙන් උපදෙස් ලබාදීම ද පුස්තකාල මෘදුකාංග නිෂ්පාදනය ද සිදුකෙරේ. මීට අමතරව පුස්කාලයාධිපතීන් සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණය (ICT) පිළිබඳ පාඨමාලා පැවැත්වීම ද සිදු කෙරේ.

## ජාත්‍යන්තර සම්බන්ධතා

ලෝකයේ අනෙකුත් රටවල පුස්තකාල ක්ෂේත්‍රයේ ආයතන හා සංවිධාන ගණනාවක ආයතනික සමාජිකත්වය ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය ලබාගෙන ඇත. මීට අමතරව විදේශීය ජාතික පුස්තකාල ගණනාවක් සමඟ පොත් හුවමාරු සේවා පවත්වාගෙන යනු ලැබේ. එමෙන්ම විදේශ රටවල පැවැත්වෙන පුස්තකාල ක්ෂේත්‍රයට අදාළ පුහුණු පාඨමාලා හා සම්මන්ත්‍රණවලට ජාතික පුස්තකාලයේ නිලධාරීහු සහභාගි වෙති. එමෙන්ම ජාතික පුස්තකාලයට විදේශ ප්‍රකාශන ලබාගැනීම සඳහා විදේශ ප්‍රකාශන ආයතන සමඟ ද සබඳතා පවත්වාගෙන යනු ලැබේ. එමෙන්ම අන්තර් ජාතික ප්‍රමිති අංක ව්‍යාපෘති (ISBN, ISSN, ISMN) ක්‍රියාත්මක කිරීමේ දී ද එම ව්‍යාපෘතිවල ජාත්‍යන්තර මූලස්ථාන සමග සම්බන්ධතා පවත්වනු ලැබේ.

## පර්යේෂණ කටයුතු

පුස්තකාල ක්ෂේත්‍රයේ පර්යේෂණ පැවැත්වීම ජාතික පුස්තකාලයට පැවරෙන කාර්යයකි. ඒ යටතේ පුස්තකාල පර්යේෂණ අංශයක් පිහිටුවා ඇති අතර ඒ මගින් පර්යේෂණ ව්‍යාපෘති ගණනාවක් පවත්වාගෙන යනු ලැබේ. පර්යේෂණ ව්‍යාපෘතිවලට අමතරව

පුස්තකාල පර්යේෂණ ක්‍රමවිද්‍යාව පිළිබඳව පුස්තකාලයාධිපතිවරුන් දැනුවත් කිරීම සඳහා වැඩමුළු ද පවත්වනු ලැබේ. මීට අමතරව ශ්‍රී ලංකාවේ පුස්තකාල කටයුතු පිළිබඳ සංඛ්‍යා ලේඛන ඇතුළත් සංඛ්‍යා ලේඛන අත්පොතක් ද සම්පාදනය කරනු ලැබේ.

# හතරවන පරිච්ඡේදය

# ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය සංවර්ධනයේ දී මුහුණ දෙන අභියෝග

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය පවත්වාගෙන යාමේ දී හා සංවර්ධනයේ දී මුහුණ දෙන අභියෝග ගණනාවකි. මෙම අභියෝගවලින් බොහොමයක් සංවර්ධනය වෙමින් පවතින රටවල ජාතික පුස්තකාල මුහුණ දී ඇති ගැටලුවලට සමාන ඒවා වේ. ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය මෑතක දී පිහිටුවීම නිසා මෙම ගැටලුවලින් බොහොමයකට විසඳුම් ලබා ගැනීමට තවමත් නොහැකි වී ඇත. කෙසේ වූව ද සමහර ගැටලු ජාතික පුස්තකාලයට පාලනය කළ නොහැකි ඒවා වේ.

## ජාතික පුස්තකාල සංකල්පය පිළිබඳ අනවබෝධය

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය පිහිටුවා වසර විසිදෙකක් පමණ ගතවූව ද ජාතික පුස්තකාල සංකල්පය පිළිබඳ අවබෝධය තවමත් ශ්‍රී ලාංකීය සමාජය තුළ ප්‍රචලිත වී නොමැති බව පෙනේ. බොහෝ දෙනෙකුගේ අදහස වන්නේ ජාතික පුස්තකාලය තවත් එක් පුස්තකාලයක් පමණක්ය යන්නයි. ජාතික පුස්තකාලය අනෙක් පුස්තකාලවලින් වෙනස් වේ. අනෙක් පුස්තකාල කිසියම් භූගෝලීය ප්‍රදේශයකට හෝ ආයතනයකට සීමාවූ ඒවා වේ. නමුත් ජාතික පුස්තකාලය සමස්ත ජාතියටම පොදුය රටේ සෑම කෙනෙකුටම එය පරිහරණය කිරීමේ අයිතිය ඇත. එමෙන්ම ජාතික පුස්තකාලය ප්‍රධාන කාර්ය භාරය රටතුළ සම්පාදනය වන සමස්ත ග්‍රන්ථ සම්භාරය ඒකරාශි කිරීමයි. එක්රැස් කිරීම මෙන්ම ජාතික එකතුව ආරක්ෂා කිරීම ද ජාතික පුස්තකාලයේ වගකීමකි. ජාතික පුස්තකාලයක් පොත් බැහැර

නොදී විමර්ශන පුස්තකාල ලෙස පමණක් පවත්වාගෙන යනු ලබන්නේ මෙසේ ජාතික එකතුව ආරක්ෂා කිරීමේ වගකීම නිසාය. එමෙන්ම පාඨක සේවා පවත්වාගෙන යාමට අමතරව තවත් ජාතික කාර්යයන් ගණනාවක් ද ජාතික පුස්තකාලයකට පැවරේ. ජාතික මට්ටමේ ග්‍රන්ථ විඥාපන හා ප්‍රලේඛන සේවා පවත්වාගෙනයාම, ජාතික හා ජාත්‍යන්තර හුවමාරු සේවා පවත්වාගෙන යාම, රටේ අනෙකුත් පුස්තකාල සඳහා නායකත්වය ලබාදීම, පුස්තකාල ක්ෂේත්‍රයේ පර්යේෂණ සමීක්ෂණ පැවැත්වීම වැනි කාර්යයන් ද ජාතික පුස්තකාලයක් විසින් ඉටු කළ යුතු වේ. ඒ අනුව ජාතික පුස්තකාලයක් යනු තවත් එක් පුස්තකාලයක් නොව වැදගත් ජාතික කාර්යභාරයක් පැවරී ඇති ආයතනයකි. මෙම සංකල්පය පිළිබඳ අනවබෝධය හේතුවෙන් ජාතික පුස්තකාල කාර්යභාරය පිළිබඳ වැරදි අර්ථකථන සිදු කිරීම නිසා ජාතික පුස්තකාලයේ පැවැත්මට හානිවන ආකාරයේ තීරණවලට එළඹීමට ද ඉඩකඩ ඇත. එබැවින් ජාතික පුස්තකාල සංකල්පය පිළිබඳ අවබෝධය වර්ධනය කිරිම කාලීන අවශ්‍යතාවකි.

## නීතිමය ගැටලු

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ සංවර්ධනය කෙරෙහි බාධාකාරී ලෙස බලපා ඇති නීතිමය ගැටලු ගණනාවක් ඇත. ඉන් ප්‍රධාන ගැටලුවක් වශයෙන් නීත්‍යානුකූල තැන්පතු නිතියේ (Legal Deposit Law) ඇති දුර්වලතා හැඳින්විය හැකිය. දැනට ක්‍රියාත්මකවන නීතිය 1885 පනවන ලද මුද්‍රණ කරුවන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥා පනත හා (Printers and Publishers Ordinance) හා 1839 පුවත්පත් ආඥා පනතයි (Newspaper Ordinance). මෙම ආඥා පනත මෙතෙක් සංශෝධනය වී නොමැත. මෙම නීතිය අනුව ශ්‍රී ලංකාවේ පළකරනු

ලබන සෑම ප්‍රකාශනයකම පිටපත් පහක් ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ තැන්පත් කළ යුතුවේ. මෙම පිටපත්වලින් එක් පිටපතක් ජාතික පුස්තකාලයට ලැබේ. ජාතික පුස්තකාලයට ප්‍රකාශන අත්පත් කරගන්නා ප්‍රධාන මාර්ගයක් ලෙස නීත්‍යානුකූල තැන්පතු ක්‍රමය හැඳින්විය හැකිය. මෙම පනතට අනුව සෑම ප්‍රකාශනයකම පිටපත් පහක් ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ තැන්පත් කළ යුතු වුවද එසේ නොකරන මුද්‍රණකරුවන්ගෙන් අය කරන දඩමුදල ඉතා සුළු එකකි. එබැවින් බොහෝ මුද්‍රණකරුවන් ප්‍රකාශන තැන්පත් කිරීමට උනන්දු නොවෙති. එබැවින් මෙම නීතිය යටතේ ජාතික පුස්තකාලයට ද බොහෝ ප්‍රකාශන නො ලැබේ.

එමෙන්ම ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය විද්‍යුත් මාධ්‍ය වැනි සමහර මාධ්‍ය මෙම පනත මගින් ආවරණය නොවේ. එබැවින් මෙම මාධ්‍ය නීත්‍යානුකූල තැන්පතු නීතිය යටතේ ජාතික පුස්තකාලයට නො ලැබේ. මෙම නීතිය කාලීන අවශ්‍යතා අනුව සංශෝධනය නොවීම ජාතික පුස්තකාලයේ සංවර්ධනයට දැඩි ලෙස බලපායි. එබැවින් නීත්‍යානුකූල තැන්පතු නීතිය කාලීන අවශ්‍යතා අනුව සංශෝධනය කිරීමට ඉක්මනින් පියවර ගැනීම අදාළ බලධාරීන්ගේ වගකීම වේ. ලෝකයේ බොහෝරටවල නීත්‍යානුකූල තැන්පතු නීති සංශෝධනය වී ඇත. නමුත් ශ්‍රී ලංකාවේ එය මෙතෙක් කිසිදු සංශෝධනයකට භාජනය කර නැත. නිත්‍යානුකූල තැන්පතු නීතියේ ප්‍රධාන අරමුණු වන්නේ රටතුළ පලවන ප්‍රකාශන කිසියම් පාලනයකට ලක්කර එම ප්‍රකාශන කිසියම් මධ්‍යගත ආයතනයක තැන්පත් කිරීමට ඉඩ සැලසීමයි. නීත්‍යානුකූල තැන්පතු නීතියේ තවත් දුර්වල තාවයක් නම් කිසියම් ප්‍රකාශනයක් ප්‍රකාශයටපත් කිරීමෙන් පසු එය ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ තැන්පත් කිරීමේ වගකීම පවරා ඇත්තේ ප්‍රකාශකයාට නොව මුද්‍රණකරුවාට වීමයි.

ජාතික පුස්තකාලය සම්පාදනය කරන ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලියට ඇතුළත් කිරීම සඳහා රටතුළ අලුතෙන් පලවන ප්‍රකාශන පිළිබඳ තොරතුරු ප්‍රධාන වශයෙන්ම ලබාගන්නේ මෙම නීත්‍යානුකූල තැන්පතු ක්‍රමය යටතේ ලැබෙන ප්‍රකාශනවලිනි. කෙසේ වුවද මෙම නීතිය යටතේ සියලුම ප්‍රකාශන තැන්පත් නොවන නිසා ජාතික ග්‍රන්ථ නාමාවලියට ද පූර්ණ වශයෙන් තොරතුරු ඇතුළත් කිරීමට අපහසු වී ඇත. ඒ අනුව මෙම ගැටලුව ජාතික ග්‍රන්ථ නාමාවලියේ ගුණාත්මක භාවය කෙරෙහි ද බලපා ඇත. ඒ අනුව වසර 126 ක් පමණ පැරණි වූ මෙම නීතිය සංශෝධනය කිරීම ශ්‍රී ලංකාවේ ග්‍රන්ථ විඥාපන පාලනය සම්බන්ධයෙන් ප්‍රබල අවශ්‍යතාවයකි.

## කාර්ය මණ්ඩල ගැටළු

කාර්ය මණ්ඩල සංවර්ධනය පහල මට්ටමක පැවතීම නිසාත් කාර්ය මණ්ඩලය සඳහා වන වරප්‍රසාද හා ප්‍රතිලාභ අඩු මට්ටමක පැවතීම නිසාත් කාර්ය මණ්ඩලය රඳවා ගැනීමේ බරපතල ගැටළුවකට ජාතික පුස්තකාලය මුහුණ පා ඇත. ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් මෙම තත්ත්වය දැඩිව පවතී. එබැවින් කාර්ය මණ්ඩලය විශාල වශයෙන් ආයතනය හැරයාම ආයතනයේ සංවර්ධනයට දැඩි බාධාවකි. එමෙන්ම කාර්ය මණ්ඩලය සඳහා ප්‍රමාණවත් පුහුණු අවස්ථා නොමැතිවීම ද කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමතාව හීන වීමට හේතු වී ඇත. වැඩි පුහුණු අවස්ථා ලබාදීම තුළින් කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමතාව හා මහජන සම්බන්ධතාව වැනි අංශ ප්‍රගුණ කළ යුතු වේ.

## ජාතික එකතුවේ සුරක්ෂිතභාවය

ජාතික එකතුවේ ආරක්ෂාව තහවුරු කිරීම ද ජාතික පුස්තකාලයේ වගකීමකි. ජාතික එකතුව සංරක්ෂණය සඳහා පොත්බැඳීම, ධූමායනය (Fumigation), ආර්ද්‍රතා පාලනය, පවිත්‍රතාවය ඇති කිරීම වැනි ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු වේ. පවත්නා මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් මෙම සංරක්ෂණ තත්ත්වයන් ඉහළ මට්ටමින් පවත්වාගෙන යාම අපහසු වී ඇත. එමෙන්ම නවීන ආරක්ෂක උපක්‍රම නොමැති වීම හේතුවෙන් පොත් අස්ථානගත වීම වැනි ගැටලුවලට ද ජාතික පුස්තකාලය මුහුණ දී ඇත.

## මූල්‍ය ගැටලු

ජාතික පුස්තකාලය රජයේ මුදල් ප්‍රතිපාදන මත යැපෙන ආයතනයකි. ආයතනයේ විවිධ කටයුතු වලින් සුළු ආදායමක් ලැබුව ද ආයතනයේ එදිනෙදා කටයුතු පවත්වාගෙන යනුයේ රජයේ භාණ්ඩාගාර ප්‍රතිපාදන මගිනි. එසේ ප්‍රතිපාදන ලැබෙනුයේ ආයතනයේ සාමාන්‍ය කටයුතු පවත්වාගෙන යාම සඳහා පමණි. එබැවින් ආයතනයේ ශීඝ්‍ර සංවර්ධනයක් සඳහා අවශ්‍යවන මූල්‍ය සම්පත්වල හිඟයක් පවතී. දීර්ඝ කාලයක් තිස්සේ පවතින භෞතික සම්පත්වල අඩුපාඩු හා වෘත්තීයමය අවශ්‍යතා රාශියක් පවතින අතර මූල්‍ය සම්පත්වල ඌනතාවය හේතුවෙන් මෙම අවශ්‍යතා ඉටුකර ගැනීමට නොහැකිවී ඇත. මෙම තත්වය ආයතනයේ සංවර්ධනයට විශාල බාධාවක් වී ඇත. පසුගිය වසර කිහිපය තුළ ආයතනය සඳහා රජය මගින් ලබාදෙන ලද ප්‍රතිපාදන පහත සඳහන් පරිදි වේ.

| | | |
|---|---|---|
| 2005 | - | රු. 45,500,000 |
| 2006 | - | රු. 54,940,000 |
| 2007 | - | රු. 75,484,000 |
| 2008 | - | රු. 74,475,000 |
| 2009 | - | රු. 82,322,760 |
| 2010 | - | රු. 71,300,000 |
| 2011 | - | රු. 71,573,000 |

## ජාතික පුස්තකාල සම්පත්වල ඌන භාවිතය

පාඨක ප්‍රජාව ජාතික පුස්තකාල සම්පත් පරිහරණය කිරීම ප්‍රමාණවත් මට්ටමක නොතිබීම ද ජාතික පුස්තකාලය මුහුණ දෙන අභියෝගයකි. කෙසේ වුව ද ජාතික පුස්තකාලය ආරම්භයේ දී තිබූ තත්ත්වය සමඟ සසඳන විට ජාතික පුස්තකාලය පරිහරණය කරන පාඨක සංඛ්‍යාව සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇත. ජාතික පුස්තකාල සම්පත් හා සේවා පිළිබඳව පාඨක ප්‍රජාව හා පර්යේෂණ ප්‍රජාව දැනුවත් කිරීම සඳහා ජාතික පුස්තකාලය විවිධ ක්‍රියාමර්ග අනුගමනය කරයි. සම්මන්ත්‍රණ පැවැත්වීම ලිපි මගින් දැනුවත් කිරීම, මාධ්‍ය ප්‍රචාරක කටයුතු මෙම ක්‍රියාමාර්ග අතර ප්‍රධාන වේ. ජාතික කියවීමේ මාසය තුළ ජාතික පුස්තකාල සාමාජිකත්වය නොමිලයේ ලබාදීම ද ජාතික පුස්තකාල සම්පත් පරිහරණය වර්ධනය වීමට හේතු වී ඇත. පුවත්පත් එකතුව, රජයේ ප්‍රකාශන එකතුව, ශ්‍රී ලංකා එකතුව ප්‍රමාණවත් පරිදි පරිහරණය කළ ද සමහර එකතු ප්‍රමාණවත් පරිදි පරිහරණය නොවේ.

# පස්වන පරිච්ඡේදය

# වෙනත් රටවල ජාතික පුස්තකාල

ලෝකයේ බොහෝ රටවල ජාතික පුස්තකාල පිහිටා ඇතත් එම සියලුම ජාතික පුස්තකාල පිළිබඳ තොරතුරු ඇතුළත් කිරීම අපහසු බැවින් ආසියාතු රටවල හා තෝරාගත් බටහිර රටවල් කිහිපයක ජාතික පුස්තකාල පිළිබඳ තොරතුරු මෙම පරිච්ඡේදයේ ඇතුළත් කර ඇත. වෙනත් රටවල ජාතික පුස්තකාල පිළිබඳ සිංහල පාඨකයින් සඳහා සම්පාදනය වූ මූලාශ්‍ර විරල බැවින් මෙම තොරතුරු සිංහල පාඨකයින්ට ප්‍රයෝජනවත් වනු ඇත. විවිධ ජාතික පුස්තකාල පිළිබඳ මූලික තොරතුරු ඇතුළත් කර පෙළගස්වා ඇත. ඒ යටතේ මෙම ජාතික පුස්තකාලවල ආරම්භය ඓතිහාසික පසුබිම සම්පත් හා සේවාවන් ආදි මූලික තොරතුරු ඇතුළත් කර ඇත.

## අයර්ලන්ත ජාතික පුස්තකාලය

අයර්ලන්තයේ ඉතිහාසය හා උරුමය ඇතුළු අයර්ලන්තයේ පුලුල් ලේඛන සම්භාරයකින් අයර්ලන්ත ජාතික පුස්තකාලය සමන්විත වේ. නිත්‍යානුකූල තැන්පතු ක්‍රමය පරිත්‍යාග හා මිල දී ගැනීම යන ක්‍රම මගින් ජාතික පුස්තකාල සම්පත් ලබාගනු ලැබේ. ජාතික පුස්තකාල එකතුව අනාගත පරම්පරාව සඳහා සංරක්ෂණය කිරීමට ද ජාතික පුස්තකාලය කටයුතු කරනු ලැබේ. අයර්ලන්ත ජාතික පුස්තකාලයේ එකතු ප්‍රධාන වර්ග හතරකට බෙදා ඇත. එනම් මුද්‍රිත මාධ්‍ය අත්පිටපත් දෘශ්‍ය මාධ්‍ය හා ඩිජිටල් මාධ්‍ය වශයෙනි. මුද්‍රිත මාධ්‍යවලට පොත් සඟරා පුවත්පත් නිල ප්‍රකාශන සිතියම් හා සංගීත ප්‍රකාශන අයත් වේ. අවුරුදු දහසක් දක්වා ඈතට දිවයන පැරණි අත්පිටපත් ලක්ෂ දහයකින් පමණ අත්පිටපත් එකතුව සමන්විත වේ. දෘශ්‍ය එකතුව ඡායාරූප පින්තූර හා චිත්‍රවලින්

සමන්විත වේ. ඩිජිටල් එකතුව ඩිජිටල් සම්පත්වලින් සමන්විත වේ. අයර්ලන්ත ජාතික පුස්තකාලය සඳහා නීතිමය බලය ලැබී ඇත්තේ 1997 ජාතික සංස්කෘතික ආයතන පනත මගිනි. එම පනතට අනුව අයර්ලන්තය පිළිබඳව හෝ අයර්ලන්තය හා සම්බන්ධ පුස්තකාල සම්පත් වර්තමාන හා අනාගත පාඨකයින් සඳහා එක්රැස් කිරීම අරමුණ වී ඇත. අයර්ලන්ත ජාතික පුස්තකාලයේ පොත්පත් එක් රැස්කිරීමේ වත්මන් අරමුණු සකස් වී ඇත්තේ එහි එකතු සංවර්ධන ප්‍රතිපත්තිය අනුවය. අයර්ලන්ත ජාතික පුස්තකාලය සඳහා පුස්තකාල සම්පත් ලබා ගැනීමේ ප්‍රධාන මාර්ගයක් වන්නේ නීත්‍යානුකූල තැන්පතු ක්‍රමයයි. මෙම ක්‍රමය යටතේ ප්‍රකාශකයින් විසින් තම ප්‍රකාශනවල පිටපත් ජාතික පුස්තකාලයට ලබාදෙනු ලබයි. නීත්‍යානුකූල තැන්පතු ක්‍රමය ක්‍රියාත්මක වන්නේ 2000 වර්ෂයේ කර්තෘ අයිතිය හා ආසන්න අයිතීන් පිළිබඳ පනත (Copy right and related right Act) මගිනි. පරිත්‍යාග වශයෙන් ද පොත් විශාල ප්‍රමාණයක් ජාතික පුස්තකාලයට ලැබේ. ජාතික පුස්තකාලයට ලබාදෙන පරිත්‍යාගවලට බදු සහනද රජය මගින් ලබාදී ඇත. පොත් ලබා ගැනීමේ අනෙක් ක්‍රමය වන්නේ මිල දී ගැනීමයි.

## ඉන්දියානු ජාතික පුස්තකාලය

ඉන්දියානු ජාතික පුස්තකාල ව්‍යාපාරයේ වැදගත් සංධිස්ථානයක් ලෙස 1903 වර්ෂයේදී ඉන්දියානු අධිරාජ්‍ය පුස්තකාලය (Imperial Library) පිහිටුවීම හැඳින්විය හැකිය. අධිරාජය පුස්තකාලය පිහිටුවන ලද්දේ අධිරාජ්‍ය පුස්තකාල පනත (Imperial Library Act) මගිනි. අධිරාජ්‍ය පුස්තකාලය පවත්වාගෙන යාමට අදාළ සම්පූර්ණ වියදම ඉන්දීය රජය මගින් දරන ලදි. අධිරාජ්‍ය පුස්තකාලයේ

ප්‍රථම පුස්තකාලයාධිපතිවරයා වූයේ බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ සහකාර අධ්‍යක්ෂවරයෙකු වූ ජෝන්මැක්පාලන් (John Macfarlane) මහතාය. අධිරාජ්‍ය පුස්තකාලයේ ප්‍රථම බෙංගාල ජාතික පුස්තකාලයාධිපතිවරයා වූයේ හරිනාත් ඩී (Harinath De) මහතාය. ඔහු 1907 සිට 1911 දක්වා අධිරාජ්‍ය පුස්තකාලයේ පුස්තකාලයාධිපතිවරයා වශයෙන් කටයුතු කළේය. අධිරාජ්‍ය පුස්තකාලයේ පරිපාලනය ප්‍රතිසංවිධානය කිරීම සඳහා අවශ්‍ය යෝජනා ඉදිරිපත් කිරීමට කමිටුවක් ද පත්කරන ලදී. මෙම පුස්තකාලය තැන්පතු පුස්තකාලයක් වශයෙන් ප්‍රකාශයට පත් කළ යුතු බව කමිටුව නිර්දේශ කරන ලදී. අධිරාජ්‍ය පුස්තකාලයේ නම වෙනස් කරමින් 1948 දී ජාතික පුස්තකාලය පනතක් මගින් පිහිටුවන ලදි. එසේ නම වෙනස් කිරීමෙන් පසු ජාතික පුස්තකාල සමාලෝචන කමිටුවේ (National Library Reviewing Committee) නිර්දේශය මත ජාතික පුස්තකාලයේ පුස්තකාලයාධිපති තනතුර අධ්‍යක්ෂ තනතුරක් වශයෙන් උසස් කරන ලදී. අධිරාජ්‍ය පුස්තකාලය ජාතික පුස්තකාලය බවට පරිවර්තනය කිරීමේදී අධිරාජ්‍ය පුස්තකාලයේ අරමුණු සමාලෝචනය කිරීමට හෝ නැවත සලකා බැලීමට කටයුතු නොකෙරිණි. කෙසේ වූවද ජාතික පුස්තකාලයේ කටයුතු සමාලෝචනය කිරීමට හා අනාගත සංවර්ධනය සඳහා ගතයුතු ක්‍රියාමාර්ග යෝජනා කිරීම සඳහා 1968 දී අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සමාලෝචන කමිටුවක් පත් කරන ලදී. කමිටුවේ වාර්තාව 1969 ජූලි මාසයේ දී ඉදිරිපත් කරන ලද අතර ජාතික පුස්තකාලයේ පහත සඳහන් අංග තිබිය යුතු බවට අදාළ වාර්තාව මගින් නිර්දේශ කරන ලදී.

1. රට තුළ පලවන සියලුම වැදගත් මුද්‍රිත ද්‍රව්‍ය ලබාගැනීම හා සංරක්ෂණය
2. ඕනෑම රටක පළකරන ඉන්දියාව පිළිබඳ මුද්‍රිත ද්‍රව්‍ය එක්රැස් කිරීම හා එම ඡායාරූප එක්රැස් කිරිම

3 ජාතික වැදගත්කමක් සහිත අත්පිටපත් ලබාගැනීම හා සංරක්ෂණය
4 රටට අවශ්‍යවන විදේශ ප්‍රකාශන සැලසුම් සහගතව ලබාගැනීම
5 ග්‍රන්ථ විඥාපන හා ප්‍රලේඛන සේවා ලබාදීම
6 නිර්දේශිත මධ්‍යස්ථානය (referral centre) වශයෙන් කටයුතු කිරීම
7 ඡායාපිටපත් සේවා ලබාදීම
8 ජාත්‍යන්තර පොත් හුවමාරු හා ජාත්‍යන්තර පොත් පිරුළු මධ්‍යස්ථානය වශයෙන් කටයුතු කිරීම

මෙම නිර්දේශ ඉන්දීය රජය පිළිගන්නා ලද අතර දැනට මෙම නිර්දේශ ක්‍රියාත්මක වේ.

ඉන්දියානු ජාතික පුස්තකාලය වඩා නවීන විද්‍යාත්මක ක්‍රම අනුව ප්‍රතිසංවිධානය කිරීම හා සංවර්ධනය කිරීම සඳහා ඉන්දියානු ජාතික පුස්තකාල පනත 1976 දී සම්මත කර ගන්නා ලදී. මෙම පනත අනුව ඉන්දියානු ජාතික පුස්තකාලය පරිපාලනය කරනු ලබන්නේ ස්වාධීන ආයතනයක් මගිනි.

ජාතික පුස්තකාලය විසින් පහත සඳහන් පුස්තකාල සම්පත් අත්පත් කරගත යුතු බව ද අදාළ සමාලෝචන කමිටුව නිර්දේශ කරන ලදී.

1 ලෝකයේ ඕනෑම රටක ඕනෑම භාෂාවකින් පළ කරන ඉන්දියාව පිළිබඳ පොත් හා සඟරා
2 දැනට ජාතික පුස්තකාලයේ නොමැති 1954 ට පෙර පලකරන ලද ඉන්දියානු ප්‍රකාශන
3 ඉන්දියානු කර්තෘවරුන් විසින් විදේශ රටවල පළකරන ග්‍රන්ථ
4 විමර්ශන ග්‍රන්ථ

5 පුස්තකාල විද්‍යාව පිළිබඳ ග්‍රන්ථ
6 බෙංගාලි හා උර්දු භාෂාවලින් පළවී ඇති සියලුම පකිස්තානු ප්‍රකාශන
7 විද්‍යාත්මක හා තාක්ෂණික විෂයයන්
8 අධ්‍යාපනය, කෘෂිකර්මය, සැලසුම්කරණය හා සංවර්ධනය පිළිබඳ ග්‍රන්ථ
9 දැනට ජාතික පුස්තකාලයේ ඇති එහෙත් අබලන් වී ඇති පොත් වෙනුවට පොත් ලබාගැනීම
10 ජාතික පුස්තකාල එකතුවේ ඇති අඩු පාඩු සම්පූර්ණ කිරීම
11 වැදගත් පර්යේෂණ සඟරාවල පැරණි කලාප
12 පවරන ප්‍රතිපාදන මත විදේශ භාෂාවලින් ප්‍රකාශන ලබාගැනීම

13 දුර්ලභ හා මුද්‍රණයේ නොමැති පොත්වල සූක්ෂම සේයා හා ඡායාපිටපත්
14 ලෝකයේ සුප්‍රසිද්ධ පුද්ගලයින්ගේ චරිතාපදාන
15 ඉතිහාසය භූගෝල විද්‍යාව සමාජ විද්‍යාව වැනි විෂයයන් පිළිබඳ උසස් මට්ටමේ ග්‍රන්ථ

## ඕස්ට්‍රේලියානු ජාතික පුස්තකාලය

ඕස්ට්‍රේලියානු ජාතික පුස්තකාලය පිහිටුවන ලද්දේ 1960 වර්ෂයේදීය. 1960 ජාතික පුස්තකාල පනත මගින් එය පිහිටුවන ලදී. ඕස්ට්‍රේලියානු ජාතික පුස්තකාලය අග්‍රාමාත්‍ය හා අමාත්‍ය මණ්ඩල දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වේ.

ඕස්ට්‍රේලියානු ජාතික පුස්තකාලයේ අංශ පහත පරිදිවේ.

1 මාලික ප්‍රකාශන (Serial) කළමනාකරණ ප්‍රමිති අංශය
2 ඕස්ට්‍රේලියානු එකතු කළමනාකරණ හා සංරක්ෂණ අංශය
3 වෙබ් ලේඛනාගාර හා සංඛ්‍යාංක සංරක්ෂණ අංශය
4 විදේශ එකතු කළමනාකරණ අංශය
5 සංඛ්‍යාංකකරණ හා ඡායාරූප අංශය

**එකතු**

ඕස්ට්‍රේලියානු ජාතික පුස්තකාලය පහත සඳහන් එකතුවලින් සමන්විත වේ.

තැන්පතු එකතුව
වාරසඟරා එකතුව
පින්තූර එකතුව
ඡායාරූප එකතුව
සංගීත එකතුව
වාචික ඉතිහාසය පිළිබඳ එකතුව

**සේවා**

පහත සඳහන් සේවාවන් පවත්වාගෙන යනු ලැබේ.

විමර්ශන සේවය
විද්‍යුත් තොරතුරු සේවය
ලේඛන බෙදාහැරීමේ සේවය (Document Delivery)
අන්තර් පුස්තකාල පිරුළු සේවය

ප්‍රකාශන ගත සූචිකරණ දත්ත සේවය (CIP)
අන්තර් ජාතික ප්‍රමිති අංක සේවය (ISBN, ISSN, ISMN)
ඡායාපිටපත් සේවාව
කියවීම් කාමර පහසුකම්

## කාම්බෝජ ජාතික පුස්තකාලය

කොම්බොඩියානු ජාතික පුස්තකාලය ඉදිකරන ලද්දේ 1920 වර්ෂයේදීය. එය විවෘත කරන ලද්දේ 1929 වර්ෂයේදීය. විවෘත කරන විට එහි පොත් එකතුව 2879 ක් පමණ විය. මෙම පුස්තකාලය වැඩිවශයෙන් භාවිත කරන ලද්දේ රජයේ නිලධාරීන් හා ප්‍රංශයෙන් පැමිණි උගතුන් විසිනි. 1975 පමණ වනවිට ජාතික පුස්තකාල එකතුව සැලකිය යුතු මට්ටමකට වර්ධනය කර ගැනීමට ජාතික පුස්තකාලයට හැකිවිය.

කොම්බොඩියානු ජාතික පුස්තකාලයේ මෙහෙවර වන්නේ රටතුළ ඇති ජාතික ලිඛිත උරුමය ඒකරාශී කර සංරක්ෂණය කිරීමයි. කොම්බොඩියාවේ ලේඛන උරුමය එක්රැස්කිරීම, මහජන පුස්තකාල සේවා ප්‍රවර්ධන කිරීම අනෙකුත් පුස්තකාලවල කටයුතු සඳහා සහාය ලබාදීම පුස්තකාල අතර සම්පත් බෙදාගැනීම හා අන්තර් පුස්තකාල පිරුළු, සේවා කටයුතු සම්බන්ධීකරණය ජාතික පුස්තකාලයේ ප්‍රධාන කාර්යයන් වේ.

කොම්බොඩියානු ජාතික පුස්තකාලය ජාත්‍යන්තර මූල්‍ය හා තාක්ෂණික සහාය ඇතිව පහත සඳහන් ව්‍යාපෘති ප්‍රමුඛතා පදනමක් මත ක්‍රියාත්මක කරයි.

1975 ට පෙර පළ වූ ප්‍රකාශන විද්‍යුත් මාධ්‍යයට පරිවර්තනය කිරීම

නීත්‍යානුකූල තැන්පතු නීතිය ඇති කිරීම තුළින් ජාතික ග්‍රන්ථ නාමාවලිය වැඩි දියුණු කිරීම.

අන්තර් පුස්තකාල ප්‍රවේශ පහසුකම් ඇති කිරීම හා පුස්තකාල වෙබ් අඩවි ඇති කිරීම. මෙම ව්‍යාපෘතියේ අරමුණ පාඨකයින්ට පර්යේෂකයින්ට හා උගතුන්ට කොම්බෝඩියානු ජාතික පුස්තකාලයට ප්‍රවේශ වීමට අවස්ථාව ලබාදීමයි. සූචිකරණ කටයුතු සඳහා දැනට CDS/ISIS මෘදුකාංගය භාවිත කරයි. කාම්බෝජය ජාතික පුස්තකාලය පර්යේෂණ පුස්තකාලයක් වන අතර රට තුළ මහජන පුස්තකාල සේවයක් නොමැති නිසා මහජන පුස්තකාලයක් වශයෙන් ද කටයුතු කරයි. කොම්බෝඩියානු ජාතික පුස්තකාලය සතුව පුළුල් කොම්බෝඩියානු එකතුවක් මෙන්ම ඓතිහාසික ඉංග්‍රීසි හා ප්‍රංශ පොත් එකතුවලින් ද සමන්විත වේ.

ප්‍රංශ එකතුව 1924 පමණ තෙක් පැරණි එකතුවක් වන අතර එහි ඇති ග්‍රන්ථ ප්‍රමාණය 20000 ක් පමණ වේ. ඓතිහාසික වැදගත් කමකින් යුත් පුස්කොල පොත් එකතුවක් ද ජාතික පුස්තකාලය සතුව ඇත. ජාතික පුස්තකාලයට අමරතව රාජකීය මාලිගය ජාතික කෞතුකාගාරය හා බෞද්ධ විහාරස්ථානවල ද පුස්කොල පොත් ඇත. යුනෙස්කෝ සංවිධානයේ ආධාර ඇතිව කොම්බෝඩියානු ජාතික පුස්තකාලය නවීකරණය කරන ලද අතර නවීකරණ කටයුතු 2004 වර්ෂයේ දී අවසන් කරන ලදී. නීත්‍යානුකූල තැන්පතු නීතිය ස්ථාපිත කිරීම සඳහා ව්‍යාපෘතියක් 2004 වර්ෂයේදී ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතියේ අරමුණ රට තුළ පළකරන ග්‍රන්ථ ජාතික පුස්තකාලය තුළ තැන්පත් කිරීම සඳහා ප්‍රකාශකයින්ට නීතිමය වශයෙන් බලපෑමක් ඇති කිරීමත් ඒ තුළින් කොම්බෝඩියාවේ ලිඛිත

උරුමය ආරක්ෂා කිරීමත්ය. අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක (ISBN) හා මාලික අංක (ISSN) ව්‍යාපෘති ද ජාතික පුස්තකාලය ක්‍රියාත්මක කරයි. කොම්බොඩියානු ජාතික පුස්තකාලය ක්‍රියාත්මක වන්නේ සංස්කෘතික හා ලලිත කලා අමාත්‍යාංශය යටතේ ඇති පොත් හා කියවීම පිළිබඳ දෙපාර්තමේන්තුව යටතේය. ග්‍රාමීය ප්‍රදේශවලට ජංගම පුස්තකාල සේවා ද ජාතික පුස්තකාලය පවත්වා ගෙනයනු ලබයි. යුනෙස්කෝ හා යුනිසෙප් ආයතනවල සහාය ඇතිව තොරතුරු සාක්ෂරතා වැඩ සටහන් ද ක්‍රියාත්මක කරයි.

## කැනේඩියානු ජාතික පුස්තකාලය

කැනේඩියානු ජාතික පුස්තකාලය ආරම්භ කරන ලද්දේ 1953 වර්ෂයේ දීය. පාර්ලිමේන්තු පනතක් මගින් එය ස්ථාපිත කර ඇත. 2004 වර්ෂයේදී ජාතික පුස්තකාලය ජාතික ලේඛනාගාරය සමග ඒකාබද්ධ කරන ලදී. කැනේඩියානු උරුමය පිළිබඳ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. වර්තමාන හා අනාගත පරම්පරාවන්ගේ ප්‍රයෝජනය සඳහා කැනඩාවේ ප්‍රකාශිත උරුමය එක්රැස් කිරීම හා සංරක්ෂණය කිරීම ජාතික පුස්තකාලයේ වගකීම වේ. කැනඩාවේ ප්‍රකාශන උරුමය තුළින් එරට ජනතාවට තම රට පිළිබඳව දැනගත හැකි ආකාරයේ ලෝක මට්ටමේ ජාතික එකතුවක් ගොඩනැගීමත් තොරතුරු සම්පත් පිළිබඳ ජාතික හා ජාත්‍යන්තර ජාලවලට ප්‍රවේශ වීමට කැනේඩියානු ජනතාවට පහසුකම් සැලසීමත් කැනේඩියානු ජාතික පුස්තකාලයේ අරමුණු වේ.

ජාතික පුස්තකාල එකතුව ප්‍රකාශන මිලියන 16 කින් පමණ සමන්විත වේ. එයට පොත්, වාරසඟරා, කැනේඩියානු නිබන්ධන, පුවත්පත්, නිල ප්‍රකාශන, සංගීත මාධ්‍ය, දුර්ලභ පොත්, සාහිත්‍ය අත්පිටපත්, ළමා ග්‍රන්ථ, පුස්තකාල විද්‍යාව පිළිබඳ ප්‍රකාශන ආදියෙන් සමන්විත වේ.

## කියුබානු ජාතික පුස්තකාලය

කියුබානු ජාතික පුස්තකාලය ආරම්භ කරන ලද්දේ 1901 වර්ෂයේ දී ය. කියුබානු ජාතික පුස්තකාලය පිහිටුවන ලද්දේ කියුබාව ස්පාඤ්ඤයෙන් නිදහස ලැබූ ඓතිහාසික කාල පරිච්ඡේදයේ දී ය. 1901 දී කියුබාවේ පැවති හමුදා පාලනය විසින් පිහිටුවන ලද කියුබානු ජාතික පුස්තකාලයේ ප්‍රථම අධ්‍යක්ෂවරයා වූයේ ඩොමින්ගෝ පිහරෝලා කැනීඩා (Domingo Figarola Caneda) මහතාය. 1901 දී ආරම්භ වූ ජාතික පුස්තකාලය 1958 වර්ෂය දක්වාම මහජන පුස්තකාල සමග සම්බන්ධතා පැවැත්වීමක් සිදු නොවීය. කියුබානු ජාතික පුස්තකාලය ආරම්භ කිරීමේදී ඇති වූ ගැටලුවක් වූයේ ඒ සඳහා ප්‍රමාණවත් ග්‍රන්ථ හා ලේඛන නොතිබීමයි. 1959 වන විට පුළුල් ලෙස ක්‍රියාත්මක වීමට අවස්ථාව ලැබිණි. 1959 වන විට ඉතිහාසය සාහිත්‍යය සංගීතය හා විද්‍යාව පිළිබඳ ග්‍රන්ථ සම්භාරයක් ඒකරාශි කර ගැනීමටත් සංවිධානය කර ගැනීමටත් හැකිවිය. එමෙන්ම කියුබානු සංස්කෘතිය පිළිබඳ ග්‍රන්ථ ඒකරාශි කිරීමට ද උත්සාහ කළේය. කියුබානු විප්ලවයෙන් වසර පහකට පසු එනම් 1964 දී කියුබාව තුළ මහජන පුස්තකාල 32 ක් විය. 1987 වන විට කියුබාවේ මහජන පුස්තකාල සංඛ්‍යාව 328 ක් විය. කියුබානු විප්ලවයෙන් පසු සංස්කෘතික වෙනස්කම් ඇති කිරීමේ මාර්ගයක් වශයෙන් මහජන පුස්තකාල පද්ධතිය යොදා ගන්නා ලදී. කියුබානු ජාතික පුස්තකාලයේ කාර්ය භාරය සාකච්ඡාකර සංවර්ධනය කිරීම සඳහා සම්මන්ත්‍රණ මාලාවක් 1969 සිට 1975 දක්වා පවත්වන ලදී.

## කොරියානු ජාතික පුස්තකාලය

කොරියානු ජාතික පුස්තකාලය ආරම්භ කරන ලද්දේ 1945 වර්ෂයේදීය. එය කොරියාවේ සෝල් නුවර පිහිටා ඇත. 1963 දී ජාතික පුස්තකාල පනත සම්පාදනය කරන ලද අතර එය නැවත 1987 දී ජාතික පුස්තකාල පනත සංශෝධනය කරන ලදී. කොරියානු ජාතික පුස්තකාලයේ සම්පූර්ණ එකතුව 8055000 පමණ වේ. සංවිධාන ව්‍යුහය සකස් වී ඇත්තේ ජාතික පුස්තකාලයේ විවිධ දෙපාර්තමේන්තු යටතේ අංශ ක්‍රියාත්මක වන ආකාරයටය. ඒවා පහත පරිදි වේ.

1 සැලසුම් හා පුහුණු දෙපාර්තමේන්තුව

සාමාන්‍ය කටයුතු අංශය
සැලසුම් හා සම්බන්ධීකරණ අංශය
පුස්තකාලයාධිපතීන් පුහුණු කිරීමේ අංශය
ජාත්‍යන්තර සහයෝගීතා හා මහජන සම්බන්ධතා අංශය

2 පුස්තකාල සේවා දෙපාර්තමේන්තුව

ප්‍රතිග්‍රහණ හා තාක්ෂණික අංශය
පිරිසැකසුම් අංශය
මහජන සේවා අංශය
වාරසඟරා හා රජයේ ප්‍රකාශන අංශය

ඩිජිටල් පුස්තකාල දෙපාර්තමේන්තුව

ඩිජිටල් පුස්තකාල සැලසුම් අංශය
ඩිජිටල් පුස්තකාල සේවා අංශය
තොරතුරු තාක්ෂණ අංශය

ළමුන් හා යෞවනයින් සඳහා වන ජාතික පුස්තකාලය

සාමාන්‍ය සහාය අංශය
සැලසුම් හා සහයෝගීතා අංශය
මහජන සේවා අංශය

කොරියාව තුළ පළකරන සියලුම ප්‍රකාශන එක්රැස් කිරීම කොරියානු ජාතික පුස්තකාලය සිදුකරයි. පුස්තකාල හා කියවීම ප්‍රවර්ධන නීතිය මගින් රටතුළ පළවන සියලුම ප්‍රකාශන ජාතික පුස්තකාලයට ලබා ගැනීම සඳහා නීතිමය රාමුවක් ලබා දේ. නීත්‍යානුකූල තැන්පතු නීතිය මගින් ප්‍රධාන වශයෙන් ලැබෙනුයේ මුද්‍රිත ප්‍රකාශන වේ. කොරියානු ජාතික පුස්තකාලයට නීතිමය පදනම ලැබී ඇත්තේ 1987 සංශෝධිත පුස්තකාල පනත, 1991 පුස්තකාල ප්‍රවර්ධන නීතිය හා 1994 පුස්තකාල හා කියවීම ප්‍රවර්ධන නීතිය මගිනි. පුස්තකාල හා කියවීම ප්‍රවර්ධන නීතිය අනුව කොරියානු ජාතික පුස්තකාලයේ කාර්යයන් පහත පරිදි වේ.

දේශීය හා ජාත්‍යන්තර තොරතුරු එක්රැස් කිරීම හා සංවිධානය

කොංග්‍රස් පුස්තකාලය (ඇමරිකා එක්සත් ජනපදය)

කොංග්‍රස් පුස්තකාලය 1800 දී කොංග්‍රස් පුස්තකාල පනත මගින් පිහිටුවන ලදී. මෙම පුස්තකාලය ආරම්භ කරන ලද්දේ ඇමරිකානු කොංග්‍රස් මණ්ඩලයේ සාමාජිකයින්ගේ ප්‍රයෝජනය සඳහාය. කොංග්‍රස් පුස්තකාලය 1814 දක්වා වොෂින්ටන් නුවර පවත්වාගෙන

ගිය අතර එම වර්ෂයේදී ආක්‍රමණික බ්‍රිතාන්‍ය හමුදා විසින් මෙම පුස්තකාලයට ගිනි තබා විනාශ කරන ලදී. එසේ විනාශ කර මාසයක් ඇතුළත ඇමරිකාවේ විශ්‍රාමික ජනාධිපතිවරයෙකු වූ තෝමස් ජෙපර්සන් මහතා ඔහුගේ පෞද්ගලික පුස්තකාලය කොංග්‍රස් පුස්තකාලය සඳහා ලබා දෙන ලදී. ඔහුගේ එකතුවේ තිබූ පොත් සංඛ්‍යාව 6487 ක් විය. කොංග්‍රස් පුස්තකාලයට පදනම ඇතිවූයේ මේ ආකාරයෙනි. 1864 සිට 1897 දක්වා කොංග්‍රස් පුස්තකාලයේ පුස්තකාලයාධිපති වශයෙන් කටයුතු කළ අයින්ස් වර්ත් රැන්ඩ් ස්පොප්පෝඩ් (Ainsworth Rand Spofford) කොංග්‍රස් පුස්තකාලය ජාතික ආයතනයක් තත්වයට වර්ධනය කළේය. 1870 දී ඇති කරන ලද ප්‍රකාශන හිමිකම් නීතිය හඳුන්වා දෙන ලද්දේ ස්පොප්පෝඩ් විසිනි. මෙම නීතිය අනුව සෑම ප්‍රකාශකයෙකුම තම ප්‍රකාශනවලින් පිටපත් දෙකක් කොංග්‍රස් පුස්තකාලයට ලබා දිය යුතු වේ. මෙම නීතිය පැනවීමෙන් පසු පොත්, පත්‍රිකා, සිතියම්, සංගීත ප්‍රකාශන, ඡායාරූප ආදිය සම්පත් අති විශාල ප්‍රමාණයක් කොංග්‍රස් පුස්තකාලයට ලැබිණි. මෙම විශාල පොත්පත් ප්‍රමාණය තැන්පත් කිරීමට ගොඩනැගිල්ලේ ඉඩ ප්‍රමාණවත් නොවූ අතර මේ පිළිබඳව ස්පොප්පෝඩ් මහතා විසින් කොංග්‍රස් මණ්ඩලය දැනුවත් කරන ලදී. ඒ අනුව වොෂින්ටන් නුවර සිටි ගෘහනිර්මාණ ශිල්පීන් වූ ජෝන් එල් ස්මිත්මෙයර් (John L. Smithmeyer) හා පෝල් ජේ පේස් (Paul J. Peiz) මහත්වරුන් විසින් සකස් කරන ලද සැලස්මකට අනුව නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමට 1886 දී කොංග්‍රස් මණ්ඩලය විසින් බලය පවරන ලදී. කොංග්‍රස් පුස්තකාලය ගොඩනැගිලි තුනකින් සමන්විත වේ. එනම් 1897 දී ඉදිකළ තෝමස් ජෙපර්සන් ගොඩනැගිල්ල 1938 දී ඉදිකළ ජෝන් ඇඩම්ස් ගොඩනැගිල්ල හා 1981 දී ඉදිකළ ජේම්ස් මෙඩිසාන් අනුස්මරණ ගොඩනැගිල්ල වශයෙනි. කොංග්‍රස් පුස්තකාලය අංශ ගණනාවකින් සමන්විත වේ. එනම් පුස්තකාලයාධිපතිවරයාගේ කාර්යාලය, කොංග්‍රස් පර්යේෂණ

සේවය, ඇමරිකා එක්සත් ජනපද ප්‍රකාශන හිමිකම් කාර්යාලය, කොංග්‍රස් නීති පුස්තකාලය, පුස්කාල සේවා අංශය, උපායමාර්ගික වැඩසටහන් කාර්යාලය හා සහායක මෙහෙයුම් කාර්යාලය වශයෙනි. කොංග්‍රස් පුස්තකාලයේ වර්තමාන ග්‍රන්ථ එකතුව මිලියන 151 පමණ වන අතර භාෂා 470 කින් යුත් පොත් හා වෙනත් මුද්‍රිත මාධ්‍ය මිලියන 34.5 ක් හා අත්පිටපත් මිලියන 66.6 ක් ඊට ඇතුළත් වේ. පුස්තකාලයේ විවිධ එකතුවල ප්‍රමාණයන් පහත සඳහන් පරිදි වේ.

| එකතු | ප්‍රමාණය |
|---|---|
| පොත් | 22,765,967 |
| විශාල ප්‍රමාණයේ පොත් (1501 ට පෙර මුද්‍රණය කළ) | 11,762,851 |
| විශේෂ එකතුව | 117258,960 |
| ශ්‍රව්‍ය මාධ්‍ය | 3,379,634 |
| අත්පිටපත් | 66,634,349 |
| සිතියම් | 5,446,673 |
| සූක්ෂම සේයා පට / පත්‍ර | 16,627,084 |
| සංගීත ප්‍රකාශන | 6,454,774 |
| දෘශ්‍ය මාධ්‍ය (චලන ඡායාපට,ඡායාරූප, පෝස්ටර් චිත්‍ර) | 15,366,922 |

කොංග්‍රස් පුස්තකාලයේ ස්ථිර සේවක සංඛ්‍යාව 3525 කි.

# චීන ජාතික පුස්තකාලය

චීන ජාතික පුස්තකාලයේ ආරම්භය 1909 දක්වා ඈතට දිවයයි. එහි මූලාරම්භය 1909 දී පිහිටුවන ලද අගනුවර පුස්තකාලයයි. (Capital Library) චීන ජාතික පුස්තකාලය සඳහා නීත්‍යානුකූල තැන්පතු පිටපත් ලබා ගැනීම ආරම්භ කරන ලද්දේ 1966 දීය. 1928 දී ජාතික බීජිං පුස්තකාලය (National Beiqing Library) වශයෙන් නම් කරන ලදී. 1987 දී වර්ෂයේ සිට එය චීන ජාතික පුස්තකාලය (National Library of China) වශයෙන් නම් කරන ලදී. එහි විශාලත්වය වර්ග මීටර් 250000 ක් පමණ වේ. ජාතික පුස්තකාල එකතුව ලෝකයේ පස්වන විශාලම එකතුව වේ. මෙම ප්‍රමාණයෙන් 270000 ක් දුර්ලභ ග්‍රන්ථ වේ. 1600000 ක් පැරණි පොත් වේ. චීන ජාතික පුස්තකාලයේ කාර්යයන් ගණනාවකි. එනම්

1 පර්යේෂණ පුස්තකාලයක් වශයෙන් කටයුතු කිරීම
2 දේශීය ප්‍රකාශන සඳහා ජාතික තැන්පතු මධ්‍යස්ථානය වශයෙන් කටයුතු කිරීම.
3 ජාතික ග්‍රන්ථ විඥාපන මධ්‍යස්ථානය වශයෙන් කටයුතු කිරීම
4 තොරතුරු ජාල පිළිබඳ ජාතික මධ්‍යස්ථානය වශයෙන් කටයුතු කිරීම
5 පුස්තකාල පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය ලෙස කටයුතු කිරීම

### විශේෂ සේවා

1 විද්‍යුත් තොරතුරු සේවය
2 ශ්‍රව්‍ය දෘශ්‍ය සේවය

3 පරිවර්තන සේවය
4 ලේඛන බෙදාහැරීමේ සේවය
5 තොරතුරු සේවය
6 වාරික ප්‍රකාශන (Serial) තොරතුරු සේවය
7 උපාධි නිබන්ධන මධ්‍යස්ථානය
8 දුර්ලභ පොත් සංරක්ෂණය

**චීන ජාතික පුස්තකාලයේ අංශ**

1 ප්‍රතිග්‍රහණ හා සූචිකරණ අංශය
2 එකතු කළමනාකරණ හා පාඨක සේවා අංශය
3 වාරික ප්‍රකාශන අංශය / අන්තර් ජාතික ප්‍රමිති මාලික අංක මධ්‍යස්ථානය (ISSN)
4 දුර්ලභ පොත් අංශය
5 විමර්ශන පර්යේෂණ හා පුහුණු අංශය

## ජපාන ජාතික පුස්තකාලය (National Diet Library)

ජපාන ජාතික පුස්තකාල නීතිය (National Diet Library Law) මගින් 1948 දී ජපාන ජාතික පුස්කාලය පිහිටුවන ලදී. මෙය ජපානයේ ඇති එකම තැන්පතු පුස්තකාලය වේ. ජපානයේ පළවන සියලුම ප්‍රකාශන එක්රැස්කිරීම ජාතික සංස්කෘතික උරුමයක් වශයෙන් සංරක්ෂණය කිරීම ජපාන ජාතික පුස්තකාලයේ වගකීම වේ.

ජපාන ජාතික පුස්තකාලයේ ප්‍රධාන එකතු පහත පරිදි වේ.

1. නූතන දේශපාලන හා ව්‍යවස්ථා පිළිබඳ එකතුව. (මෙම එකතුව ග්‍රන්ථ ලක්ෂ තුනකින් පමණ සමන්විත වේ.)
2. ජපානයේ පශ්චාත් යුද සමය පිළිබඳ එකතුව.
3. පාර්ලිමේන්තු ලේඛන හා නිල ප්‍රකාශන එකතුව.
4. විද්‍යා හා තාක්ෂණ එකතුව.
5. සිතියම් එකතුව.
6. ශ්‍රව්‍ය මාධ්‍ය එකතුව (Sound recordings).
7. ජපානය පිළිබඳ ලියවුණු විදේශීය පොත් එකතුව.
8. ආසියාතු භාෂා එකතුව.
9. දුර්ලභ හා පැරණි ග්‍රන්ථ එකතුව.
10. ටොකුහාවා ශොගුනේට් ලේඛන එකතුව (ටොකුහාවා ශාගුනේට් රජයෙන් ලබා ගත් ලේඛන මෙයට ඇතුළත් වේ.
11. ඉටෝ බුන්කෝ හා ශිරායි බුන්කෝ එකතුව අත්පිටපත් හා දැව මත මුද්‍රණය කළ පොත් (Wood block - printed books) 5000 ක් පමණ මෙයට අයත් වේ.
12. සින්ජෝ බුන්කෝ එකතුව (සින්ජෝ බුන්කෝ - (1873-1938) නැමති තාරකා විද්‍යාඥයා එක්රැස්කළ තාරකා විද්‍යාව පිළිබඳ පැරණි ලේඛන හා කැලැන්ඩර් මෙම එකතුවට අයත් වේ.

## නවසීලන්ත ජාතික පුස්තකාලය

නවසීලන්ත ජාතික පුස්තකාලය ආරම්භ කරන ලද්දේ 1965 වර්ෂයේ දී ය. අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. ජාතික පුස්තකාල එකතුව පොත්, වාරසඟරා, අත්පිටපත්, කාටූන්, සිතියම්, පුවත්පත්, වාචික ඉතිහාසය, ඡායාරූප, ශ්‍රව්‍ය පොත් ((Audio books) සංඛ්‍යාංක මාධ්‍ය (Digital materials) වැනි සම්පත්වලින් සමන්විත වේ.

### සේවා

පාඨමාලා හා වැඩමුළු
ජාතික ඒකාබද්ධ සූචිය
පාසල් කාර්ය මණ්ඩල සඳහා ක්ෂණික තොරතුරු සේවා
අන්තර් පුස්තකාල පිරුළු සේවය
නවසීලන්ත ජාතික ග්‍රන්ථ නාමාවලිය
පොත් කවර ඡායාරූප සේවාව
නවසීලන්ත අනුක්‍රමණිකාව
සාඟරා හා පුවත්පත් ලිපි, ග්‍රන්ථ සමාලෝචන, කවි, කෙටිකතා ආදිය මෙහි ඇතුළත් වේ)
නවසීලන්ත පුස්තකාල නාමාවලිය

## පාකිස්ථාන ජාතික පුස්තකාලය

1962 කර්තෘ අයිතිය පිළිබඳ ආඥා පනත හා 1992 කර්තෘ අයිතිය පිළිබඳ පනත යටතේ පාකිස්ථාන ජාතික පුස්තකාලය ජාතික තැන්පතු පුස්තකාලය (National depository) වශයෙන් කටයුතු කරයි. මෙම ආඥා පනතට අනුව පාකිස්ථානයේ සෑම ප්‍රකාශනයකම තමන් පළකරන ප්‍රකාශනවල පිටපතක් ජාතික පුස්තකාලයට ලබාදීම අනිවාර්ය වේ. මෙම තැන්පතු එකතුවේ ප්‍රධාන අරමුණ වන්නේ රටතුළ පළවන සියලුම ප්‍රකාශිත ද්‍රව්‍ය වත්මන් හා මතු පරම්පරාවේ ප්‍රයෝජනය සඳහා සංරක්ෂණය කිරීමයි. පාකිස්ථානු ජාතික පුස්තකාලය සතු සම්පත් පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| පොත් හා වාරසඟරා | 140000 |
| සූක්ෂම සේයාපට | 48000 |

| | |
|---|---|
| තැන්පතු පිටපත් | |
| පොත් | 62000 |
| පුවත්පත් | 321 |
| දුර්ලභ පොත් හා අත්පිටපත් | |
| අත්පිටපත් | 580 |
| දුර්ලභ පොත් | 10000 |

පාකිස්ථාන ජාතික පුස්තකාලයේ අරමුණු පහත සඳහන් පරිදි වේ.

- පාකිස්ථානය හා එහි ජනතාව පිළිබඳ හා ජාතික වැදගත් කමකින් යුත් කාලීන හා පැරණි ග්‍රන්ථ ලබා ගැනීම
- කර්තෘ අයිතිය පිළිබඳ නීතිය යටතේ තැන්පත් කරන ජාතික ප්‍රකාශිත උරුමය ලබාගැනීම හා පවත්වාගෙන යාම

- පාකිස්ථානයේ සමාජ ආර්ථික හා සංස්කෘතික සංවර්ධන ක්ෂේත්‍රවල කටයුතු කරන ප්‍රධාන පුද්ගලයින් සඳහා පාඨක වර්ගීකරණය තොරතුරු සේවා හා ලේඛන බෙදාහැරීමේ සේවා (Document Delivery) මගින් පුස්තකාල සම්පත් භාවිතය ප්‍රවර්ධනය කිරීම හා දිරිගැන්වීම.
- ප්‍රවර්ථන ජාතික ග්‍රන්ථ නාමාවලිය හා පූර්වකාලීන ජාතික ග්‍රන්ථ නාමාවලිය සම්පාදනය කිරීම.
- රටේ පුස්තකාල කටයුතු සැලසුම් කිරීමේදී ඒ සඳහා සහභාගිවීම
- ජාත්‍යන්තර පොත් හුවමාරු සේවා සංවිධානය කරන නියෝජිතායතනය වශයෙන් කටයුතු කිරීම
- පුස්තකාලයාධිපතිවරුන්ට පුහුණුව හා අධ්‍යාපනය ලබාදීම සඳහා සම්මන්ත්‍රණ වැඩමුළු සමුළු සංවිධානය හා නව තාක්ෂණය භාවිතය දිරිගැන්වීම.
- පුස්තකාල හා පුස්තකාල සේවාවල ප්‍රමිතිය උසස් කිරීම සඳහා කාර්යක්ෂමව කටයුතු කිරීම හා පුස්තකාල අවශ්‍යතා හඳුනා ගැනීම සඳහා පර්යේෂණ පැවැත්වීම.
- ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනය හා වැදගත් පුස්තකාලවල සම්පත් පිළිබඳ දත්ත පදනම සකස් කිරීම සඳහා කටයුතු යෙදීම
- ජාත්‍යන්තර පුස්තකාල රැස්වීම් හා සම්මන්ත්‍රණවලට සහභාගී වීම.

# දකුණු අප්‍රිකානු ජාතික පුස්තකාලය

දකුණු අප්‍රිකානු ජාතික පුස්තකාලය දකුණු අප්‍රිකාවේ දැනුම් සම්භාරය ආරක්ෂා කරන්නා මෙන්ම දැනුම ලබා දෙන්නා ද වේ. දකුණු අප්‍රිකාවේ ප්‍රකාශිත ලේඛන සම්භාරය ඒකරාශි කිරීමත්, සංරක්ෂණය කිරීමත්, එම දැනුම ලබාදීමට ප්‍රවේශ පහසුකම් සැලසීමත් දකුණු අප්‍රිකානු ජාතික පුස්තකාල පනත අනුව දකුණු අප්‍රිකානු ජාතික පුස්තකාලයේ වගකීම වේ. දුර්ලභ අත්පිටපත්, දකුණු අප්‍රිකාවේ පළකරනු ලබන පොත්, වාර සඟරා, රජයේ ප්‍රකාශන, විදේශීය ප්‍රකාශන, සිතියම්, තාක්ෂණික වාර්තා හා පුවත්පත් දකුණු අප්‍රිකානු ජාතික පුස්තකාලයේ එකතු වේ. දකුණු අප්‍රිකානු ජාතික පුස්තකාලය අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් පාලනය වේ. කලා හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. ජාතික පුස්තකාලයේ ප්‍රධාන විධායක නිලධාරියා වන්නේ අධ්‍යක්ෂ පුස්තකාලයාධිපතිවරයාය. විශ්වවිද්‍යාල, පර්යේෂණ ආයතන වැනි ව්‍යවස්ථාපිත ආයතනවලට සමාන මට්ටමේ ආයතනයක් ලෙස ජාතික පුස්තකාලය ක්‍රියාත්මක වේ. දකුණු අප්‍රිකානු ජාතික පුස්තකාලයේ ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ.

1 දකුණු අප්‍රිකාවේ පළකරන හෝ දකුණු අප්‍රිකාව පිළිබඳ ප්‍රකාශිත ලේඛන පිළිබඳ සම්පූර්ණ එකතුවක් ගොඩනැගීම

2 දකුණු අප්‍රිකාව තුළ පළවන හෝ දකුණු අප්‍රිකාව පිළිබඳව ඇති ප්‍රකාශිත හා අප්‍රකාශිත අනෙකුත් එකතු පවත්වාගෙන යාම හා පුළුල් කිරීම

3 ජාතික සම්පතක් වශයෙන් දකුණු අප්‍රිකාවේ අනෙකුත් පුස්තකාලවල ප්‍රකාශිත ලේඛන එකතු කළමනාකරණය ප්‍රවර්ධනය කිරීම

4 ජාතික ග්‍රන්ථ විඥාපන සේවා සැපයීම හා ජාතික ග්‍රන්ථ විඥාපන නියෝජිතායතනය වශයෙන් කටයුතු කිරීම

5 ජාතික හා ජාත්‍යන්තර වශයෙන් ප්‍රකාශන හා ලේඛනවලට උපරිම ප්‍රවේශය ප්‍රවර්ධනය කිරීම

6 ජාතික හා ජාත්‍යන්තර වශයෙන් තොරතුරු සේවාවලට ප්‍රවේශ පහසුකම් සැලසීම

7 ජාතික සංරක්ෂණ පුස්තකාලය වශයෙන් කටයුතු කිරීම හා ජාතික මට්ටමින් සංරක්ෂණ සේවා සැපයීම

8 ජාතියේ ප්‍රකාශිත උරුමය පිළිබඳ දැනුවත්භාවය වර්ධනය කිරීම හා අගය කිරීම

9 තොරතුරු පිළිබඳ දැනුවත් කිරීම (Information awareness) හා තොරතුරු සාක්ෂරතාව (Information literacy) ප්‍රවර්ධනය කිරීම

## බංග්ලාදේශ ජාතික පුස්තකාලය

1971 වසරේ දී බංග්ලාදේශය නිදහස ලබාගත් අතර නිදහසෙන් පසු සංස්කෘතික අපේක්ෂාවන් ඉටුකර ගැනීම සඳහා ජනතාව උනන්දු වූ අතර එහිදී ජාතික පුස්තකාලයක අවශ්‍යතාවද විවිධ පාර්ශවයන් විසින් පෙන්වා දෙන ලදී. ඒ අනුව මධ්‍යම පුස්තකාලය ජාතික පුස්තකාලය වශයෙන් ප්‍රකාශයට පත් කරන ලද අතර එය 1972 දී ඩකා නුවර ආරම්භ කරන ලදී. බංග්ලාදේශ ජාතික පුස්තකාලය එරට සංස්කෘතික අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. 2005

වර්ෂයේදී සංශෝධනය කරන ලද කර්තෘ අයිතිය පිළිබඳ නීතිය අනුව එකම තැන්පතු පුස්තකාලය මෙයවන අතර බංග්ලාදේශයේ ප්‍රධාන දූණුම් මධ්‍යස්ථානය ද වේ.

බංග්ලාදේශ ජාතික පුස්තකාලය අංශ ගණනාවකින් සමන්විත වන අතර ඒවා පහත සඳහන් පරිදි වේ.

1 මධ්‍යම ප්‍රතිග්‍රහණ අංශය
2 ජාතික ග්‍රන්ථ නාමාවලී අංශය
3 ග්‍රන්ථ විඥාපන විමර්ශන / අන්තර් ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක අංශය
4 පාඨක සේවා අංශය
5 තොරතුරු තාක්ෂණ අංශය
6 සූක්ෂම සේයාපට සංරක්ෂණ අංශය
7 ආයතන අංශය

බංග්ලාදේශ ජාතික පුස්තකාලය සඳහා පොත් සඟරා ආදිය මිල දී ගැනීමේ දී හා පරිත්‍යාග වශයෙන් ලබාගැනීමේ දී පහත සඳහන් ප්‍රතිපත්ති අනුව කටයුතු කරනු ලැබේ.

1 ලෝකයේ ඕනෑම රටක බංග්ලාදේශය පිළිබඳව පළකරන පොත් හා සඟරා
2 විදේශ රටවලදී බංග්ලාදේශ ජාතිකයින් පළකරන පොත්
3 නොබෙල් ත්‍යාග ලාභීන් විසින් ලියන ලද සමකාලීන පොත් හා වෙනත් රටවල ජාතික මට්ටමින් පළවන හොඳම පොත
4 ආසියාතු රටවල් හා වෙනත් රටවල් පිළිබඳව ලියවී ඇති ඉහළ මට්ටමේ පොත්
5 සියලුම විෂයයන් පිළිබඳව ප්‍රවේශමෙන් තෝරාගත් නවතම පොත්

6 උසස් මට්ටමේ විමර්ශන ග්‍රන්ථ

7 ලෝකයේ විශිෂ්ට පුස්තකාලයාධිපති චරිතාපදාන

8 ජාතික මට්ටමේ උගතුන්ගේ පෞද්ගලික එකතු

බංග්ලාදේශ ජාතික පුස්තකාල එකතුවේ ප්‍රධාන ලක්ෂණය නම් සියලුම ප්‍රධාන විෂය ධාරාවන්ට අදාළ පොත් ඇතුළත් වී තිබීමත් විශේෂයෙන්ම දකුණු ආසියාව පිළිබඳ ප්‍රකාශන විශාල එකතුවක් තිබීමත්ය. ලබාදෙන සේවාවන් වශයෙන් විමර්ශන සේවය, විශේෂ ග්‍රන්ථ නාමාවලී බැහැරදෙන සේවය, ඡායාපිටපත් සේවය, අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක සේවය, සූක්ෂම සේයාපට සේවය, අන්තර්ජාල හා ඊමේල් සේවය හැඳින්විය හැක.

## බ්‍රිතාන්‍ය ජාතික පුස්තකාලය

බ්‍රිතාන්‍ය ජාතික පුස්තකාලය (The British Library) පිහිටුවීම සම්බන්ධයෙන් ද දීර්ඝ ඉතිහාසයක් ඇත. බ්‍රිතාන්‍ය ජාතික පුස්තකාලය පිහිටුවීම සඳහා ද යෝජනා ගණනාවක් ඉදිරිපත් විය. මෙසේ යෝජනා ඉදිරිපත් කළ ආයතන අතර පුස්තකාල පිළිබඳ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කමිටුව හා ජාතික පුස්තකාල කමිටුව ප්‍රධාන තැනක් ගනී. ඒ අනුව බ්‍රිතාන්‍ය පුස්තකාල පනත (British Library Act) මගින් 1972 දී මෙය පිහිටුවන ලදී. කෙසේ වූවද බ්‍රිතාන්‍ය ජාතික පුස්තකාලය ක්‍රියාත්මක වීම ආරම්භ වූයේ 1973 ජුලි මාසයේය. බ්‍රිතාන්‍ය ජාතික පුස්තකාලයේ අරමුණු පහත සඳහන් පරිදි වේ.

1 රටතුළ පලවන සියලුම පොත් හා වාරසඟරාවලින් අවම වශයෙන් පිටපත බැගින් ලබා ගැනීම සහ හැකිතරම් විදේශ ප්‍රකාශන ලබාගැනීම. මෙහි අරමුණ හැකිතරම් පුළුල් විමර්ශන සේවාවක් ලබාදීමයි. කිසියම් පාඨකයෙක් තොරතුරක් සොයා ගැනීමට අපහසුතාවක් තිබේ නම් එය බ්‍රිතාන්‍ය පුස්තකාලයෙන් සොයා ගත හැකි බව ඔහු දනී.

2 රටේ අනෙකුත් පුස්තකාල හා තොරතුරු පද්ධතිවලට සහාය වීමක් වශයෙන් කාර්යක්ෂම මධ්‍යගත බැහැරදෙන හා ඡායාපිටපත් සේවයක් ලබාදීම.

3 ප්‍රධාන පුස්තකාලවල පමණක් නොව රට පුරා ඇති පුස්තකාලවල අවශ්‍යතා අනුව හා ප්‍රධාන විදේශ පුස්තකාලවල සහාය ඇතිව මධ්‍යගත සූචිකරණ හා ග්‍රන්ථ විඥාපන සේවාවන් ලබාදීම.

බ්‍රිතාන්‍ය ජාතික පුස්තකාල පනත අනුව ඉහත අරමුණ ඉටුකර ගැනීම සඳහා බ්‍රිතාන්‍ය ජාතික පුස්තකාලයේ කාර්යයන් ගණනාවක් දක්වා ඇත. ඒවා පහත පරිදි වේ.

1 මුද්‍රිත හෝ වෙනත් ආකාරයකින් පවතින පොත් අත්පිටපත් සඟරා චිත්‍රපට හා අනෙකුත් ලේඛනවලින් සමන්විත පුළුල් එකතුවකින් බ්‍රිතාන්‍ය ජාතික පුස්තකාලය සමන්විත වේ.

2 විද්‍යාත්මක තාක්ෂණික හා මානව ශාස්ත්‍රවලට සම්බන්ධ විමර්ශන අධ්‍යයන හා ග්‍රන්ථ විඥාපන හා වෙනත් තොරතුරු සේවා ලබාදීමේ ජාතික මධ්‍යස්ථානය ලෙස කටයුතු කිරීම.



182960

3 විශේෂයෙන් අධ්‍යාපන ආයතන පුස්තකාල හා කර්මාන්ත සඳහා සේවා ලබා දීම.

4 පුස්තකාලය විසින් පර්යේෂණ පැවැත්වීම හා පර්යේෂණ සඳහා අනුග්‍රහ දැක්වීම හා ඒ තුළින් පුස්තකාල හා තොරතුරු සේවා ලබාදෙන ආයතනවලට සහාය වීම.

## මැලේසියානු ජාතික පුස්තකාලය

මැලේසියානු ජාතික පුස්තකාලය ආරම්භ කරන ලද්දේ 1966 වර්ෂයේදී ජාතික ලේඛනාගාරයේ ඒකකයක් වශයෙනි. එය වෙනම ස්වාධීන ආයතනයක් බවට පත් වූයේ 1977 වර්ෂයේදීය. මැලේසියානු ජාතික පුස්තකාලයේ දැක්ම (Vision) පහත සඳහන් පරිදි වේ.

පුස්තකාල සංවර්ධන සේවාවන්හි හා නායකත්වය තුළ මැලේසියානු ජාතික පුස්තකාලය ලෝක මට්ටමේ නායකයෙකු බවට පත් වීම. මැලේසියානු ජාතික පුස්තකාලයේ මෙහෙවර (Mission) පහත සඳහන් පරිදි වේ.

- පුස්තකාල සංවර්ධනයේ හා පුස්තකාල සේවාවන්වල නායකත්වය දැරීම
- ජාතික උරුමය සඳහා වූ විශිෂ්ට මධ්‍යස්ථානය බවට පත්වීම
- ජාතික තොරතුරු සම්පත්වලට පහසුවෙන් ප්‍රවේශය ලබාදීම හා කළමනාකරණය කිරීම
- මැලේසියානු ජනතාව තුළ කියවීමේ පුරුද්ද ප්‍රවර්ධනය කිරීම

## මැලේසියානු ජාතික පුස්තකාල අරමුණු

පුස්තකාල සම්පත්වල ජාතික එකතුවක් වත්මන් හා අනාගත පරම්පරාවන්ගේ ප්‍රයෝජනය සඳහා ලබාදීම.

- රට තුළ හා විදේශ රටවල ඇති පුස්තකාල සම්පත් වලට ජාතික මට්ටමින් ප්‍රවේශ වීමට පහසුකම් සැලසීම.
- පුස්තකාල කටයුතු සම්බන්ධයෙන් නායකත්වය ලබාදීම.

## ජාතික පුස්තකාල එකතු

පොත් එකතුව
වාර සඟරා එකතුව
පුවත්පත් එකතුව
සම්මන්ත්‍රණ පත්‍රිකා එකතුව
සිතියම් එකතුව
විද්‍යුත් මාධ්‍ය එකතුව
අත්පිටපත් එකතුව
විශේෂ එකතු
භාවඩ් එකතුව
පුද්ගලික එකතු
ආසියානු එකතුව
එක්සත් ජාතීන්ගේ එකතුව
දුර්ලභ පොත් එකතුව

## සේවා

විමර්ශන සේවය
බැහැරදෙන සේවය
ප්‍රලේඛන සේවය
සංඛ්‍යාංක සේවය (Digital Service)
ඡායාපිටපත් සේවය
තොරතුරු සාක්ෂරතා වැඩ සටහන්
පාඨක අධ්‍යාපන සැසි
ප්‍රජා තොරතුරු සේවය
අන්තර්ජාතික ප්‍රමිති අංක සේවා (ISBN, ISSN, ISMN)
ප්‍රකාශන සැපයුම් සේවය
උපදේශක සේවය

## රුසියානු ජාතික පුස්තකාලය

රුසියානු ජාතික පුස්තකාලය පිහිටා ඇත්තේ රුසියාවේ ශාන්ත පීටර්ස්බර්ග් නුවරය. එය රුසියාවේ විශාලම පුස්තකාලය වේ. රුසියාවේ ජාතික පුස්තකාලයේ ආරම්භය 1795 ඉම්පීරියල් මහජන පුස්තකාලය පිහිටුවීමයි. ඉම්පීරියල් මහජන පුස්තකාලය නිල වශයෙන් විවෘත කරන ලද්දේ 1814 ජනවාරි 3 වන දිනය. 1814 වන විට පුස්තකාල එකතුව 3, 000, 000 විය. 1970 වන විට පුස්තකාල එකතුව 17,000, 000 විය. ජාතික පුස්තකාල එකතුව පොත්, සඟරා, පුවත්පත්, නිල ප්‍රකාශන, සංගීත ප්‍රකාශන, මුද්දර, චිත්‍ර, අත්පිටපත් ආදි සම්පත්වලින් සමන්විත වේ. දැනට ජාතික පුස්තකාල එකතුවේ ප්‍රමාණය 35, 718, 000 වේ. මෙයින් 15, 000, 000 ක් පොත් වේ. නීත්‍යානුකූල තැන්පතු ක්‍රමය යටතේ ද ප්‍රකාශන ලබා ගනු ලැබේ. ජාතික පුස්තකාලයේ කාර්ය මණ්ඩලය 1850 ක් වේ.

## ස්කොට්ලන්ත ජාතික පුස්තකාලය

ස්කොට්ලන්ත ජාතික පුස්තකාලය ස්කොට්ලන්තයේ පිහිටි විශාලම පුස්තකාලය වේ. ස්කොට්ලන්ත ජාතික පුස්තකාලයේ එකතු පහත සඳහන් පරිදි වේ.

- බ්‍රිතාන්‍ය එකතුව
- ව්‍යාපාර එකතුව
- ඩිජිටල් එකතුව
- විදේශ එකතුව
- අත්පිටපත් එකතුව
- සිතියම් එකතුව
- සංගීත එකතුව
- පුවත්පත් එකතුව
- රාජ්‍ය ප්‍රකාශන එකතුව
- දුර්ලභ පොත් එකතුව
- විද්‍යා හා තාක්ෂණ එකතුව

බ්‍රිතාන්‍ය හා ස්කොට්ලන්ත ග්‍රන්ථ විශේෂයෙන්ම නීත්‍යානුකූල තැන්පතු ක්‍රමය යටතේ ලබා ගනු ලැබේ. ජාතික පුස්තකාල එකතුවේ සම්පත් පිළිබඳ තොරතුරු ප්‍රධාන සූචිය තුළින් ලබාගත හැකිය. මාර්ගගත ලියාපදිංචිය මගින් ද ජාතික පුස්තකාල සම්පත් භාවිත කළ හැකිය. පුස්තකාල සාමාජික කාඩ් පත හෝ මාර්ගගත ලියාපදිංචිය තිබේ නම් පොත් කලින් ඇණවුම් කළ හැකිය. 2002 තොරතුරු නිදහස පිළිබඳ පනත යටතේ ස්කොට්ලන්තයේ ඕනෑම අයෙකුට ජාතික පුස්තකාල සම්පත් භාවිත කළ හැකිය.

# ආශ්‍රිත ග්‍රන්ථ


අමරසිරි, එම්. එස්. යූ., (සංස්) ජාතික පුස්තකාල සමරු කලාපය : කොළඹ, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය, 1990

Das Gupta, Kapana (ed.), National Library and Public Library : Culcutta, National Library of Culcutta, 1987.

Humpreys, K. W., A National Library in theory and in practice : London, 1988.

Line, Maurice, Line Joyce, (ed.) National Libraries : London, 1987.

National Libraries in the knowledge based society, proceedings of the National Library of Thailand's Centennial Celebration International Conference : Bangkok, 2005.

Penna, C. V., Foskett, P. J. Sewell, P. H., National Library and Information Services : A hand book for planners : London, 1977.

# ආශ්‍රිත ජාතික පුස්තකාල වෙබ් ලිපින

| | | |
|---|---|---|
| අයර්ලන්තය | - | www.nli.ie/ |
| එක්සත් ජනපදය | - | www.loc.gov/ |
| ඉන්දියාව | - | www.nationallibrary.gov.in/ |
| ඕස්ට්‍රේලියාව | - | www.nla.gov.au/ |
| කාම්බෝජය | - | www.bnc-nlc.info. |
| කැනඩාව | - | www.collectionscanada.gc.ca |
| කොරියාව | - | www.nl.go.kr/ |
| ජපානය | - | www.ndl.go.jp/ |
| චීනය | - | www.nlc.gov.cn/ |
| තායිලන්තය | - | www.nlt.go.th |
| දකුණු අප්‍රිකාව | - | www.nlsa.ac.za/ |
| නවසීලන්තය | - | www.natlib.govt.nz/ |
| පාකිස්ථානය | - | www.nlp.gov.pk |
| බංග්ලාදේශය | - | www.nanl.gov.bd/ |
| බ්‍රිතාන්‍යය | - | www.bl.uk/ |
| මැලේසියාව | - | www.pnm.gov.my/ |
| රුසියාව | - | www.nlr.ru/ |
| ස්කොට්ලන්තය | - | www.nls.uk/ |

1316



මෙම ග්‍රන්ථයේ කර්තෘ වන
ජී. ඩී. අමරසිරි මහතා දැනට ජාතික
පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ
අධ්‍යක්ෂ වරයෙකු වශයෙන් කටයුතු කරයි.
ඒ මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව
විද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය
ලබා ඇති අතර,
කොළඹ විශ්ව විද්‍යාලයෙන් පුස්තකාල හා
විඥාපන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති
උපාධිය ලබා ඇත.

**ISBN : 978-955-8383-76-6**

මිල රු. 200.00

## පසුවදන

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අධ්‍යක්ෂ වරයෙකු වශයෙන් කටයුතු කරන ජී. ඩී. අමරසිරි මහතා රචනා කර ඇති මෙම කෘතිය ජාතික පුස්තකාල කටයුතු පිළිබඳව පාඨක ප්‍රජාව දැනුවත් කිරීම සඳහා බෙහෙවින් ඉවහල් වනු ඇතැ යි විශ්වාස කරමි. අමරසිරි මහතා මීට පෙරද පුස්තකාල ක්ෂේත්‍රය පිළිබඳ ග්‍රන්ථ ගණනාවක් සම්පාදනය කර ඇත. මොහු මෙම ක්ෂේත්‍රය පිළිබඳ පුළුල් දැනුමක් හා දීර්ඝකාලීන පළපුරුද්දක් ඇති නිලධාරියෙකි. පුස්තකාල විද්‍යාව පිළිබඳ පොත් බිහිවීම සීමිතව ඇති මෙවන් අවධියක මෙම පොත සම්පාදනය කිරීම අගය කොට සලකමි.

එන්. එච්. එම්. චිත්‍රානන්ද
අධ්‍යක්ෂ ජනරාල් (වැ. බ.)
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන
සේවා මණ්ඩලය

ප්‍රකාශනය :

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
අංක 14, නිදහස් මාවත
කොළඹ 07

**National Digitization Project**

*National Science Foundation*

Institute : National Library and Documentation Services Board

1. Place of Scanning : National Library and Documentation Services Board. Co
2. Date Scanned : 2017/10/19
3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara
4. Scanning Officer

Name : N.P.R.Gamage

Signature : ........................

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my s the norms and standards of digital scanning accurately, also keeping with the c document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Library Documentation Office

Name : Iromi Wijesundara

Signature : Irom

Date : 2017/10/19.

*"This document/publication was digitized under National Digiti National Science Foundation, Sri Lanka"*